# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயற்றிறன் அறிக்கை

# Annual Performance Report

# 2021

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**தேசிய திட்டமிடல் திணைக்களம்**

**நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு**

**Department of National Planning**
**Ministry of Finance, Economic Stabilization and National Policies**

# 2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
# වැය ශීර්ෂ අංකය 237

පිටු අංකය


01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 3

1.1. හැඳින්වීම 3
1.2. ආතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
1.3. ප්‍රධාන කාර්යයන් 4
1.4. සංවිධාන සටහන 5
1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6
1.6. දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල් 6
1.7. විදේශ අධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්) 6

02 පරිච්ඡේදය -ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

2.1 සාර්ව ආර්ථික සංවර්ධනය, සංචාරක,කර්මාන්ත සහ වෙළෙඳ 7
2.2 කෘෂිකර්මය, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත් , ධීවර, පරිසර හා ආපදා කළමනාකරණය 9

2.3 මාර්ග, වරාය, ගුවන් සේවා , ප්‍රවාහන ,විදුලිබල හා බලශක්තිය, ජල හා සනීපාරක්ෂක සේවා 16
2.4 නාගරික සංවර්ධන සහ නිවාස 18
2.5 සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය විද්‍යාව, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ හා සමාජ ආරක්ෂණය 19
2.6 රාජ්‍ය කළමනාකරණය සහ පාලනය, සංස්කෘතික හා ආගමික කටයුතු 23
2.7 ශ්‍රමික කටයුතු 24
2.8 තරුණ, ක්‍රීඩා කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධනය 25
2.9 ප්‍රාදේශිය සංවර්ධන අංශය 26
2.10 ලෝක ආහාර වැඩසටහන 28

03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 35
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 35
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 37
3.3 මුදල් ප්‍රවාහක පිළිබඳ ප්‍රකාශය 38
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 39
3.5 අදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 39
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය 40

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල
නියෝජිතයෙකු ලෙස  මෙමදෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන
ලද ප්‍රතිපාදන 40

3.8 මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීමේ කාර්ය සාධනය 41

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 41

04 පරිච්ඡේදය -කාර්ය සාධන දර්ශක 41

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව) 41

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 42

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න 42

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග
සැකෙවින් විස්තර කරන්න 42

06 පරිච්ඡේදය -මානව සම්පත් පැතිකඩ 43

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 43

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ
අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න. 43

6.3 මානව සම්පත් සංවර්ධනය 43

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 45

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 1956 දී අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ජාතික සැලසුම් සභාව ලෙස ආරම්භ වූ අතර රටේ සැලසුම් ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකි මුළු රටම ආවරණය වන පරිදි සකස් කළ සවිස්තරාත්මක ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලදී. 1961 දී මෙම සභාව තවදුරටත් ශක්තිමත් කර අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපනය කරන ලදී. ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුව කෙටිකාලීන සංවර්ධන වැඩසටහනක් සකස් කළ අතර සැලසුම් ක්‍රියාවලිය සඳහා ප්‍රවර්තන සැලසුම් සංකල්පය (rolling plan) ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. පසුව, දෙපාර්තමේන්තුව 1965 දී සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනියුක්ත කර ප්‍රාග්ධන අයවැය සකස් කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම පවරන ලදී. 1974 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මුදල් හා සැලසුම් අමාත්‍යාංශය යටතට ගෙන එන ලද අතර එතැන් පටන් එය අනුප්‍රාප්තික රජයන් විසින් වරින් වර මුදල්, සැලසුම් හා ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වගකිව යුතු අමාත්‍යාංශවලට අනුයුක්ත කරන ලදී. වර්තමානයේදී, ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා ලෙස, දෙපාර්තමේන්තුව සිය කාර්යය භාරය මූල්‍ය රෙගුලාසි අංක 3 (2) සහ අංක: 35 මගින් පවරා ඇති අධිකාරියට අනුකූලව සිදු කරනු ලැබේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

ජාතියට වඩාත්ම දක්ෂ සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා වීම.

### මෙහෙවර

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම

### අරමුණු


1. රාජ්‍ය ආයෝජන කාර්යක්ෂමව භාවිතා කිරීම

2. අදාල රේඛීය අමාත්‍යාංශ සහ ආයතනවල රාජ්‍ය ආයෝජන මගින් සමාජ ආර්ථික ප්‍රතිලාභ උපරිම වන ආකාරයට සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතවන පරිදි සකස්කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශකත්වය ලබාදීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික හා ආංශික ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයට සහාය වීම
- මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන රාමුවක් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම
- ව්‍යාපෘති යෝජනාඇගයීම
- කැබිනට් සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම
- ආංශික ප්‍රවේශය ගොඩනැංවීම සඳහා මූලිකත්වය ගැනීම
- අවශ්‍ය විටෙක සැලසුම් ක්‍රම යාවත්කාලීන කිරීම
- ජාතික, උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට මාර්ග උපදේශ සැපයීම
- විශේෂ/ කලාපීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම
- ජාතික සැලසුම් ක්‍රියාවලියට තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ධාරාවේ යෙදවීම
- සංවර්ධන හවුල්කරුවන් සමඟ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට පහසුකම් සැපයීම
- විශේෂ පැවරුම් සඳහා සහභාගී වීම
- නිකුත් කිරීමේ පත්‍රිකා සකස් කිරීම
- සැලසුම් හා අධීක්ෂණයට සම්බන්ධ ජාතික හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නිර්දේශිත ව්‍යාපෘති සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම (ක්‍රියාත්මක කිරීම දක්වා)
- කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය
- පොදු පරිපාලනය සහ මූල්‍ය

# 1.4 ආයතනික සටහන



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 8 කට වෙන් කර ඇත. එම අංශ 8 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ වලට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

මීට අමතරව, සාර්ව ආර්ථික සැලසුම්කරණය, තොරතුරු බෙදා හැරීම සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනම ආධාරක ඒකක තුනක් ඇත.

1) තොරතුරු සංවර්ධන මධ්‍යස්ථානය
2) පරිපාලන අංශය
3) මූල්‍ය අංශය

### දෙපාර්තමේන්තුවේ අංශ

- සාර්ව ආර්ථික සංවර්ධනය, සංචාරක,කර්මාන්ත සහ වෙළෙඳ
- කෘෂිකර්මය, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත් , ධීවර, පරිසර හා ආපදා කළමනාකරණය
- මාර්ග, වරාය, ගුවන් සේවා , ප්‍රවාහන ,විදුලිබල හා බලශක්තිය,ජල හා සනීපාරක්ෂක සේවා
- නාගරික සංවර්ධන සහ නිවාස
- සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය විද්‍යාව, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ හා සමාජ ආරක්ෂණය
- රාජ්‍ය කළමනාකරණය සහ පාලනය, සංස්කෘතික හා ආගමික කටයුතු
- ශ්‍රමික කටයුතු
- තරුණ, ක්‍රීඩා කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධනය
- ප්‍රාදේශීය සංවර්ධන අංශය
- ලෝක ආහාර වැඩසටහන

## 1.6. දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල්

## 1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

1. **ව්‍යාපෘතියේ නම:** ලෝක බැංකු අධාර මත ක්‍රියාත්මක ආයෝජන ව්‍යාපෘති වල හදිසි ප්‍රතිචාර සංරචකය
2. **ආධාර දෙන ආයතනය:** ලෝක බැංකුව
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය -** රු.මිලියන 10,491
4. **ව්‍යාපෘති කාලය:** 2020.09.30 – 2022.12.30

1. **ව්‍යාපෘතියේ නම**: Promoting Autonomy, Literacy and Attentiveness through Market Alliances (PALAM/A)

2. ආධාර දෙන ආයතනය : එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා
ශ්‍රී ලංකා රජයේ මුදල්

3. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : ඇමරිකන් ඩොලර් මිලියන26 සහ
රුපියල් මිලියන 140

4. ව්‍යාපෘති කාලය : 2021 -2024

1. ව්‍යාපෘතියේ නම: ලෝක ආහාර වැඩසටහන
2. ආධාර දෙන ආයතනය: ලෝක ආහාර වැඩසටහන (WFP)
3. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය - රු.මිලියන 46.5
4. ව්‍යාපෘති කාලය: 2018-2022

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 සාර්ව ආර්ථික සංවර්ධනය, සංචාරක, කර්මාන්ත සහ වෙළෙඳ

**සාර්ව ආර්ථික අංශය**

මෙම දෙපාර්තමේන්තුව තුල පවතින සාර්ව ආර්ථික අංශය අනෙකුත් සියලුම සංවර්ධන අංශයන් සමස්ත ප්‍රතිපත්ති රාමුවක් මඟින් ඒකාබද්ධ කරමින් රටේ පොදු සංවර්ධන ඉලක්කයන් වෙත මෙහෙයවනු ලබන අංශයයි. එම අංශය මඟින් දේශීය මෙන්ම විදේශීය ආර්ථිකයන් අධ්‍යයනය කිරීම සහ දේශීය ආර්ථිකය තුල පවතින අවස්ථා අභියෝග හඳුනාගනිමින්, පවතින සීමිත සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් වෙත කාර්යක්ෂම ලෙස යොමුකරනු ලබයි. තවද, එම අංශය විසින් රාජ්‍ය ආයෝජන කළමනාකරණය කිරීමේ අරමුණින් පවත්නා මූල්‍ය සම්පත් ජාතික ප්‍රමුඛතා ක්ෂේත්‍රවලට වෙන්කරමින් රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කරනු ලැබේ. ඒ අනුව, සාර්ව ආර්ථික අංශය විසින් සිදු කරනු ලැබූ කාර්යභාරයන් පහත පරිදි වේ.

- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021-2024 හි එක් එක් පරිච්ඡේදය සකස්කිරීම සඳහා අනෙකුත් සංවර්ධන අංශයන්ට සහාය වීම.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021-2024 සම්පාදනය කිරීම සහ එය ජාතික පරිශීලන ලේඛනයක් වශයෙන් පළ කිරීම.
- සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් අධ්‍යයනය කර ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුල පවතින අවස්ථා සහ අභියෝග විශ්ලේෂණය කිරීම.

**කර්මාන්ත අංශය**

ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය මහා පරිමාණ සමාගම්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (SMEs) මෙන්ම ස්වයං රැකියා ක්‍රියාකාරකම් සමඟ මූලික වශයෙන් සම්බන්ධ වූ ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යාපාර රාශියකින් සමන්විත වේ. මෙම අංශය අඛණ්ඩව රටේ ජාතික ආර්ථිකයේ සැලකිය යුතු කොටසක් ආවරණය කර ඇති අතර, දළ දේශීය නිෂ්පාදනය සඳහා දළ වශයෙන් සියයට 26 ක්, මුළු සේවා නියුක්තියෙන් සියයට 28 හා රටේ සමස්ත අපනයන සඳහා දළ වශයෙන් සියයට 84 ක දායකත්වයක් සපයයි.

කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් කෘෂිකාර්මික අංශය සහ සේවා අංශයට සමානව පසුගිය වසර දෙක තුළ රටේ කර්මාන්ත අංශයේ ක්‍රියාකාරීත්වයේ සැලකිය යුතු පසුබෑමක්

නිරීක්ෂණය වන අතර 2019 වසරට සාපේක්ෂව 2020 වසරේදී කාර්මික නිෂ්පාදනය සියයට 6.9 ක පසුබැමක් හා 2020 නොවැම්බර් මසට සාපේක්ෂව 2021 නොවැම්බර් මස සියයට 3.5ක පසුබෑමක් සටහන් වේ. මෙම පසුබිම තුළ රජයේ වර්තමාන ප්‍රතිපත්තිය මගින් අහිතකර බාහිර පරිසරයක් හමුවේ පහත වැටෙමින් පවතින කාර්මික නිෂ්පාදනය නැවත යථා තත්ත්වයට පත් කර රටේ කාර්මික සංවර්ධනයට මග පෑදීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගවල අවශ්‍යතාවය අවධාරණය කරනු ලබයි. ඊට සමගාමීව, 2021 වර්ෂය තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 46 ක් ඇගයීමට ලක්කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය නියෝජිතායතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 8ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- කර්මාන්ත අංශයට අදාළ තොරතුරු සහ දත්ත ලබා දීමෙන් 2021-2024 රාජ්‍ය ආයෝජන වැඩසටහන සැකසීමට සහාය වීම.
- කර්මාන්ත අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද නව යෝජනා ඇතුළත් කරමින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති පෙළ ගැස්ම (project pipeline) යාවත්කාලීන කිරීම.
- රටේ සංවර්ධන රාමුවට අනුකූලව සුදුසු ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට සහ අදාළ රේඛීය ආයතනවලට අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සැකසීමට අදාළ වැඩමුළු සහ රැස්වීම්වලට සහභාගී වී අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සැකසීම සහ 1990 අංක 46 දරණ කාර්මික ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පත් ලේඛන සමාලෝචනය කර අවශ්‍ය නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දීම.
- මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචන සහ විදේශ දූත මණ්ඩල ඇතුළු රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී වීම.

**වෙළඳ අංශය**

ජාතික සංවර්ධන ප්‍රතිපත්තියට අනුකූලව වෙළඳ අංශය මගින් වෙළෙන්දන්, සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන්ගේ වෙළඳ අයිතිය තහවුරු කරමින් දේශීය හා විදේශීය වෙළඳාම සඳහා පහසුකම් සලසනු ලබයි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විශේෂයෙන් ජාත්‍යන්තර වෙළඳාම පසුබෑමට ලක්වීමත් සමග වර්ෂ 2021 වෙළඳ අංශය සඳහා ඉතා අභියෝගාත්මක වසරක් විය. එබැවින් එම පසුබෑම සමනය කරගැනීම සඳහා ඩිජිටල්කරණය සහ ඊ-වාණිජකරණය මූලික කරගත් තාක්ෂණික නිපැයුම් මත පදනම් වූ අපනයන විවිධාංගීකරණය හා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය වෙත යොමු විය. ඊට සමගාමීව, 2021 වර්ෂය තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

- වෙළඳ අමාත්‍යාංශය මගින් යොමුකරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 3ක් සඳහා නිරීක්ෂණ සැපයීම.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන රජයේ ප්‍රමුඛතා සහ අයවැය සීමා සැලකිල්ලට ගනිමින් දෙපාර්තමේන්තුව වෙත එවන ලද ව්‍යාපෘති යෝජනා 17න් ව්‍යාපෘති යෝජනා 11ක් ඇගයීමට ලක්කර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම.
- ඉදිරි කාලය තුල ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති පෙළ ගැස්ම (project pipeline) යාවත්කාලින කිරීම.
- වෙළඳ අමාත්‍යාංශය සහ සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පරිභෝගික රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ඉදිරිපත්කරන ලද ව්‍යාපෘති යෝජනා ප්‍රමුඛතාගත කරමින් 2022 අයවැය ඇස්තමේන්තුව සකස්කිරීමට දායක වීම.
- වෙළඳ අංශයට අනුබද්ධ සංවර්ධන ප්‍රමුඛතා, වෙළඳ අංශය මුහුණදෙනු ලබන ගැටළු සහ අභියෝග, මූලික උපායමාර්ග සහ අනාගත ඉලක්ක හඳුනාගනිමින් රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021-2024 පිළියෙළ කිරීමට දායකත්වය සැපයීම.

**සංචාරක අංශය**

විදේශ විනිමය ඉපැයීමේ දී ආර්ථිකයේ වැදගත්ම අංශයක් ලෙස සංචාරක කර්මාන්තය පිළිගැනේ. පුළුල් ජනතා සහභාගීත්වයක් සහිත පාරිසරික සහ දේශීය සංස්කෘතික හිතකාමී කර්මාන්තයක් ලෙස සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වේ. 2025 වන විට සංචාරක කර්මාන්තයේ ඉපැයීම් ඩොලර් බිලියන 10 දක්වා ඉහළ නැංවීම, සංචාරක පැමිණීම් මිලියන 7 දක්වා වැඩි කිරීම, දැනට පවතින හෝටල් කාමර සංඛ්‍යාව දෙගුණයක් දක්වා ඉහළ නැංවීම සහ සංචාරක කර්මාන්තයේ සේවක සංඛ්‍යාව මිලියන 1 දක්වාත් වැඩි කිරීම අපේක්ෂා කෙරේ.

සංචාරක අමාත්‍යාංශය සමඟ එක්ව ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සලකා බලා නිරීක්ෂණ සැපයීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන දායකත්වය වේ. ඒ අනුව, 2021 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 12 ක් ඇගයීමට ලක්කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය නියෝජිතායතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- සංචාරක අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 5ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- සංචාරක අංශයේ අදාළ තොරතුරු සහ දත්ත ලබා දීමෙන් රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021-2024 සකස් කිරීමට සහාය වීම.
- කෙටුම්පත් කරන ලද ජාතික සංචාරක ප්‍රතිපත්තියට යෝජනා සහ නිරීක්ෂණ ලබා දීම.

## 2.2 කෘෂිකර්මය, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත්, ධීවර, පරිසර හා ආපදා කළමනාකරණය

**කෘෂිකාර්මික අංශය**

කෘෂිකාර්මික අංශය රටේ ජනගහනයෙන් ¼ කට වැඩි පිරිසකගේ ප්‍රධානතම ජීවනෝපාය වන අතර, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ශ්‍රම බලකායෙන් අඩකට ආසන්න ප්‍රමාණයකගේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 36%ක් කෘෂිකාර්මාන්තය සඳහා යොදා ගනුලබන අතර ඉන් බහුතරයක් (40%කට වඩා වැඩි) බහු වාර්ෂික වැවිලි බෝග වගාව සඳහා ද, 32% ක් වී වගාව සඳහා ද යොදා ගනු ලබයි.

2020 වසරේ රටේ මුළු ආනයන ප්‍රමාණයෙන් 9.7%ක් ආහාර පාන වර්ග ලෙස වාර්ථා වී ඇත. Covid-19 වසංගතය හේතුවෙන් රජය දේශීයව වගා කළ හැකි ඇතැම් ආහාර බෝග ආනයනය කිරීම සඳහා තාවකාලික සීමා පනවා ඇත. දේශීය වශයෙන් ලබාගත හැකි අමුද්‍රව්‍ය යොදා ගනිමින් කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කරමින් හරිත කෘෂිකාර්මික නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය සිය ප්‍රතිපත්තිමය මහ පෙන්වීම ලබා දී තිබීම විශේෂත්වයකි. ඒ අනුව අවශ්‍ය සැපයුම් පහසුකම්, අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව, පර්යේෂණ හා සංවර්ධනය, කාබනික පොහොර සහ අනෙකුත් කාබනික නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික කිරීම සඳහා විශේෂ මැදිහත්වීම් සිදු කරන ලදී.

කෘෂිකර්මාන්තය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත්තේ දේශිය ආහාර සුරක්ෂිතතාව සහ ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහතික කරමින් ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරිත්වයට ගැලපෙන තාක්‍ෂණය මත පදනම් වූ ඵලදායි, තිරසාර සහ ඉහළ ලාභදායී කෘෂිකර්මාන්තයක් බිහිකිරීමටයි.

**බෝග කෘෂිකර්මාන්තය**

බෝග කෘෂිකර්මාන්තය වී, එළවළු, අනෙකුත් ක්ෂේත්‍ර බෝග (OFCs), පලතුරු සහ කුළුබඩු, මල් වගාව සහ පත්‍ර පැල ඇතුළු අපනයන කෘෂිකාර්මික භෝග වලින් සමන්විත වේ. භෝග කෘෂිකාර්මික නිෂ්පාදනයේ මෙන්ම එහි අපනයනවල තරඟකාරිත්වය සහතික කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා රජය පියවර කිහිපයක් ගෙන ඇත. වෙනත් ක්ෂේත්‍ර බෝග (OFCs); බඩඉරිඟු, අල, ළූණු, රට කජු, මිරිස්, තල, මුං, එළ ඇට, කළු, කඩල, මෙනේරි සහ සෝයා බෝංචි යල සහ මහ කන්න එකකදී හෝ දෙකකදී ප්‍රවර්ධනය කරනු ලබන බහු වාර්ෂික බෝග වේ. අනෙකුත් ක්ෂේත්‍ර බෝග ප්‍රධාන වශයෙන් කුඩා ගොවීන් විසින් වගා කරනු ලබන අතර ගෙවතු ද අනෙකුත් ක්ෂේත්‍ර බෝග සැපයීමේ වැදගත් මූලාශ්‍රයකි. ක්ෂේත්‍ර බෝග සඳහා දේශීය ඉල්ලුම සැපිරීමට දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන බැවින් සැපයුම් හිඟය පියවා ගැනීම සඳහා දැනට බොහෝ ක්ෂේත්‍ර බෝග ආනයනය කරනු ලැබේ. ඒ අනුව, ක්ෂේත්‍ර බෝග ආනයනය වෙනුවට මෙම බෝග බොහොමයක් දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා ලබා දෙන සහයෝගය තවදුරටත් ශක්තිමත් කිරීමට රජය කටයුතු කර ඇත.

ගොවිතැන, අස්වනු නෙළීම, පසු අස්වනු කළමනාකරණය, අගය එකතු කිරීම සහ අලෙවිකරණය යන ක්ෂේත්‍රවල තාක්‍ෂණ භාවිතය, ව්‍යාප්ති සේවා ඉහළ නැංවීමට සහ කෘෂිකාර්මික අගය දාමයේ ඇති හිඩැස්වලට පිළියම් යෙදීම කෙරෙහි තවදුරටත් අවධානය යොමු විය.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික අංශය විසින් සම්පූර්ණ කරන ලද / කාර්යයන්**

- ව්‍යාපෘති යෝජනා 35 ක් ඇගයීම් සිදු කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
- කෘෂිකර්ම අමාත්‍යාංශය සහ අදාළ රාජ්‍ය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 14ක් සඳහා නිරීක්ෂණ සහ තාක්ෂණික අදහස් ඉදිරිපත් කරන ලදී.

**විශේෂ කාර්යයන්:**

• පුළුල් කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් (Overarching Agriculture Policy) සකස් කරන ලදී (අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය)

• "ආහාර අවශ්‍යතාවය, පරිභෝජනය සහ සුලභතාවය" පිළිබඳ අධ්‍යනයක්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය ඇතිව සිදුකරන ලදී.

• ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා "Livelihood Resilience in Agriculture and Tourism Development" පිළිබඳ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් සකස් කරන ලදී.

• ලෝක බැංකු මූල්‍ය ආධාර ඇතිව ක්‍රියාත්මක කිරීමට නියමිත "ඒකාබද්ධ ග්‍රාමීය ජීවනෝපාය වැඩසටහනට"(Integrated Rural Livelihoods Transformation Project) ඇතුළත් කිරීමට "Inclusive Development in Agriculture towards a prosperous farming community" පිළිබඳ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් සකස් කරන ලදී.

• කුරුඳු සඳහා GI (භූගෝලීය දර්ශකය) ලබා ගැනීමට සහ GI නීතිය අනුමත කිරීමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කරන ලදී.

• කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සඳහා ඉන්දියානු ණය පහසුකම් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීමට සහය ලබා දෙන ලදී.

• චීන රජයේ මූල්‍ය ආධාර අපේක්ෂාවෙන් "කාබනික පොහොර සංවර්ධනය සහ ප්‍රවර්ධනය" සහ "දෙමුහුන් ප්‍රභේද සංවර්ධනය" පිළිබඳ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා දෙකක් සකස් කරන ලදී.

• "කෘෂිකර්මාන්තයේ ඩිජිටල් යටිතල පහසුකම් කළමනාකරණ පද්ධතිය" පිළිබඳ සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් අදාළ පාර්ශ්ව හා සම්බන්දව පිළියෙළ කර, TAMAP II ව්‍යාපෘතිය යටතේ යුරෝපීය සංගමයේ (EU) ආධාර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**පශු සම්පත් අංශය**

පශු සම්පත් අංශය විශේෂයෙන් රටේ ග්‍රාමීය ප්‍රදේශවල මිලියන 1.6 ක පමණ ජනගහනයකට පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සඳහා දායක වන ප්‍රධාන උප අංශයකි. දළ දේශීය නිෂ්පාදිතයට 1% කට වඩා අඩු දායකත්වයක් දැක්වුවද, එම ක්ෂේත්‍රය සඳහා වන ශ්‍රම අවශ්‍යතාවය හේතුවෙන්, ග්‍රාමීය රැකියා උත්පාදනය, දරිද්‍රතාවය පිටුදැකීම සහ එමඟින් ආර්ථික සංවර්ධනයට මග පෑදීම සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්ෂේත්‍ර අතරට එය එක් වේ. මෙම අංශයට ප්‍රධාන වශයෙන් ගවයින්, මී හරකුන්, එළුවන්, කුකුළන් සහ ඌරන් ඇතිකිරීම අයත් වේ. මේ අතරින් දියර කිරි හා කුකුළන් ඇති කිරීම ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍ර වේ. රට තුළ ලියාපදිංචි සත්ව ගොවිපළ 600,000ක් පමණ ඇති අතර එම ගොවිපළවලින් 80%කට වැඩි ප්‍රමාණයක් ඌන උපයෝගිතා හෝ ආන්තික ඉඩම්වල නිෂ්ක්‍රීය ශ්‍රමිකයන් යොදවා ක්‍රියාත්මක වන්නේ ය. කිරි ගොවීන් 250,000ක් ඇතුළුව ආසන්න වශයෙන් පවුල් ඒකක 600,000ක් සෘජුවම මෙම අංශයේ නියැළී සිටිති.

මේ වන විට දේශීය දියර කිරි නිෂ්පාදනය දළ වශයෙන් ලීටර් මිලියන 427 ක් වන අතර එය රටේ සමස්ත ඉල්ලුමෙන් සියයට 50 ක් පමණ සපුරාලීමට ප්‍රමාණවත් වේ. එබැවින් නිෂ්පාදනය වැඩි කිරීම සහ දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා ඒකාබද්ධ වාණිජකරණය වූ ගොවිතැනක් කරා පරිවර්තනයක් මෙම අංශයට අවශ්‍ය වේ. මේ සඳහා දේශීය මෙන්ම දෙමුහුම් සත්ත්ව ප්‍රභේද යොදා ගනිමින් සිදු කෙරෙන සාර්ථක අභිජනනය ක්‍රමවේදයන් සඳහා පුළුල් ප්‍රවේශයක් අවශ්‍ය වේ.

කුකුළන් ඇතිකිරීමේ කර්මාන්තය සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන අතර කුකුළු මස් හා බිත්තර සඳහා වන ගෘහස්ථ අවශ්‍යතා සපුරාලීමට එයට හැකිව ඇත. බොහෝ දුරට කුකුළන්ගේ සෞඛ්‍ය මට්ටම කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ක්ෂේත්‍රය තවදුරටත් ස්ථාවර කිරීම සඳහා පර්යේෂණ සහ ප්‍රතිපත්ති සංවර්ධනය යන කටයුතු සඳහා පමණක් රජයේ කාර්යභාරය සීමා වී ඇත. කුකුළු මස් සහ බිත්තර ලාභම සත්ව ප්‍රෝටීන් ප්‍රභවයක් ලෙස පිළිගෙන ඇති බැවින් රටේ සත්ව ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිෂ්පාදන පිරිවැය අඩු කර නිෂ්පාදනය වැඩි කිරීම අත්‍යවශ්‍ය වේ. ආසියානු කලාපයේ කුරුළු උණෙන් තොර රටක් ලෙස තරගකාරීව අපනයන වෙළෙඳපොළ අත්පත් කර ගැනීමේ හැකියාව මෙම කර්මාන්තය සතුව පවතී.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ පශු සම්පත් අංශය විසින් සම්පූර්ණ කරන ලද කාර්යයන්**

• ව්‍යාපෘති යෝජනා 10 ක් ඇගයීම් සිදු කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

• පශු සම්පත් අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 6ක් සඳහා නිරීක්ෂණ සහ තාක්ෂණික අදහස් ඉදිරිපත් කරන ලදී.

**වාරිමාර්ග හා ඉඩම්**

2021 වර්ෂයේ වාරිමාර්ග අංශය සඳහා රජයේ සමස්ත වියදම රු. බිලියන 50.7 ක් වූ අතර එම මුදලින් රු. බිලියන 46.8 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කරන ලදි. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, දැදුරුඔය ජලාශ ව්‍යාපෘතිය, උමාඔය ජල හැරවුම් ව්‍යාපෘතිය, කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය, යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන්වල අවසන් අදියරේ වැඩකටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් ආරම්භ කොට ඇති මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, මොරාන ජලාශ ව්‍යාපෘතිය, මල්වතුඔය ජලාශ ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, ඒකාබද්ධ ජල හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IW&WRMP) වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරම වාරි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති රැසක් මගින් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත.

2021 දී ඉඩම් අංශයෙහි සමස්ත වියදම රු. මිලියන 9,471 ක් වන අතර එයින් රු. මිලියන 3,276 ක් ප්‍රාග්ධන වියදම් වේ. 2021 දී ඉඩම් හිමිකම් වැඩ සටහන (බිම්සවිය) සඳහා රු. මිලියන 239 ක් වැය කර ඇත. 2021 දී රු. මිලියන 1,957 ක් වැයකරමින් රාජ්‍ය සංවර්ධන වැඩසටහන් සඳහා ඉඩම් හඳුනාගෙන අත්පත් කිරීම සිදු කර ඇත.

**වාරි අංශය සිදු කල විශේෂ වැඩසටහන්**

- රාජ්‍ය ආයෝජන සැලැස්මේ - (2021-2024) ඉඩම් සහ වාරිමාර්ග අංශයේ පරිච්ඡේදය පිළියෙළ කිරීම
- JICA ආයතනයෙන් ආධාර ප්‍රධානයන් ලබා ගැනීම සඳහා උතුරු මැද පළාත් ඇළ ආශ්‍රිතව පවතින එල්ලංගා පද්ධති සංවර්ධනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඉදිරි කටයුතු සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි
- දේශගුණික විපර්යාස මගින් කෘෂිකාර්මික අංශයට සිදුවන බලපෑම පිළිබඳව සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම
- චීන රජයේ අධාර ලබාගැනීමේ අරමුණින් මහවැලි කලාප ආශ්‍රිත කුඩා වාරි කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම
- කෘෂිකර්මයට අදාල තිරසාර සංවර්ධන ඉලක්ක මිනුම් කිරීමට අවශ්‍ය දර්ශක වල වර්තමාන තත්ත්වය හා ඉදිරි ඉලක්ක විශ්ලේෂණය කිරීමට දායකත්වය ලබා දීම.
- ලෝක බැංකු අධාර ලබාගැනීමේ අරමුණින් සකස් කළ ''සමෘද්ධිමත් ගොවි ප්‍රජාවක් කරා කෘෂිකර්මාන්තයේ සංවර්ධනය'' ව්‍යාපෘති වාර්තාවේ අන්තර්ගත වාරිමාර්ග කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ එල්ලංගා පද්ධති සංවර්ධනය යන මැයෙන් වූ පරිච්ඡේදය පිළියෙළ කිරීම
- වාරිමාර්ග අංශයේ ව්‍යාපෘතිවල පිරිවැය ඵලදායි ලෙස සහ සීමිත සම්පත් උපරිම ලෙස උපයෝගී කර ගැනීම සඳහා මහවැලි ජල සුරක්ෂිතතා ආයොජන වැඩසටහන (MWSIP) අදියර II ශක්‍යතා අධ්‍යයනය සහ ගාල්ල දිස්ත්‍රික්ක ගංවතුර පාලන ව්‍යාපෘතියේ මූලික අධ්‍යයන කටයුතු සඳහා අමාත්‍යාංශය මගින් පත්කළ විශේෂ කමිටුවල සමාජිකයකු ලෙස කටයුතු කිරීම .

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි හා ඉඩම් අංශයට අයත් කාර්යයන්**

1. වාරි අංශයේ ව්‍යාපෘති වාර්තා හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා 17 ක් ඇගයීමට ලක් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.
2. වාර්මාර්ග අමාත්‍යාංශය සහ ඉඩම් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 32 කට අදාළ නිරීක්ෂණ සකස් කිරීම.
3. මොරකහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, මහවැලි ජල සුරක්ෂණ ආයෝජන වැඩසටහන, ඒකාබද්ධ ජල හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IW&WRMP) හා තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සක්‍රීයව දායකවීම.
4. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සහ ප්‍රතිපත්ති සමාලොචන රැස්වීම්වලට සක්‍රීයව දායකවීම.
5. වාරිමාර්ග හා ඉඩම් අංශයට අදාල තොරතුරු සපයමින් රාජ්‍ය ආයෝජන සැලැස්ම යාවත්කාලීන කිරීම.

**වැවිලි අංශය**

වැවිලි අංශයේ ප්‍රධාන අමාත්‍යාංශය වන වැවිලි අමාත්‍යාංශය සහ ඒ ආශ්‍රිතව ඇති වැවිලි අංශයට අදාල රාජ්‍ය අමාත්‍යාංශ තුන සඳහා අවශ්‍ය ආංශික ප්‍රතිපත්තිමය කරුණු වලට තාක්ෂණික සහය ලබා දීම සහ එම අමාත්‍යාංශ සහ අමාතයංශ යටතේ වන ආයතන මගින් ලබා දෙන සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් ව්‍යාපෘති විශ්ලේෂණය, නිර්දේශ ලබා දීම මෙන්ම ව්‍යාපෘති සැළසුම් කරණෙයහිලා  අවශ්‍ය තාක්ෂණික කරුණු ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

වැවිලි අංශය රටෙහි සමස්ත අපනයන ආදායමට දක්වන දායකත්වය සියයට 27ක් පමණ වේ. වැවිලි අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා පිරිස මිලියන 1.5ක් පමණ වේ. වැවිලි අංශයේ නිශ්පාදනය හා ඵලදායිතාවය වැඩි කරමින් වැවිලි අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා ජනතාවගේ ජීවනොපාය සුරක්ෂිත කිරීමත් රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව වැවිලි ව්‍යාපෘති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහයෝගය සහ තාක්ෂණික සහය ලබා දීමත් මෙම අංශය මගින් සිදු කෙරේ.

විශේෂ කාර්යන්

- 2022 – 2024 මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන සැලැස්මේ වැවිලි අංශයේ පරිච්ඡේදය සකස් කර අවසන් කිරීම.
- USAID සහ ලෝක බැංකු  ආධාර ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.
- ව්‍යාපෘති වාර්තා ඇගයීමට අදාලව අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනෙකුත් අදාල ආයතන සමග රැස්වීම් 5ක් සංවිධානය කර පැවැත්වීම.
- Aid Memorie, Country Diagnosis Studies (CDS) සඳහා අවශ්‍ය නිරීක්ෂණ ලබා දීම.
-
- මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා දායකත්වය ලබා දීම.
- දේශගුණික විපර්යාස මගින් කෘෂිකර්ම අංශයට සිදුවන බලපෑම පිළිබඳ සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීම
- ප්‍රගතිය 2021

| | |
|---|---|
| ලැබුණු  ව්‍යාපෘති වාර්තා ගණන | 58 |
| ඇගයීම් කළ ව්‍යාපෘති වාර්තා ගණන | 58 |
| ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන | 05 |
| නිරීක්ෂණ ලබා දුන් අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන | 05 |

**ධීවර අංශය**

ධීවර අංශයේ ප්‍රධාන අමාත්‍යාංශය වන ධීවර අමාත්‍යාංශය සහ ඒ ආශ්‍රිතව ඇති ධීවර අංශයට අදාල රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අවශ්‍ය ආංශික ප්‍රතිපත්තිමය කරුණු වලට තාක්ෂණික සහය ලබා දීම සහ එම අමාත්‍යාංශ සහ අමාතයංශ යටතේ වන ආයතන මගින් ලබා දෙන සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් ව්‍යාපෘති විශ්ලේෂණය, නිර්දේශ ලබා දීම මෙන්ම ව්‍යාපෘති සැළසුම් කරණෙයහිලා  අවශ්‍ය තාක්ෂණික කරුණු ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

ධීවර අංශය රටෙහි දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය සියයට 1 ක් පමණ වේ. ධීවර අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා පිරිස මිලියන 2.8 පමණ වේ. ධීවර අංශයේ

නිෂ්පාදනය, ඵලදායිතාවය සහ යටිතල පහසුකම් වැඩි කරමින් ධීවර අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා ජනතාවගේ ජීවනෝපාය සුරක්ෂිත කිරීමත් රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව ධීවර ව්‍යාපෘති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහයෝගය සහ තාක්ෂණික සහය ලබා දීමත් මෙම අංශය මගින් සිදු කෙරේ.

**විශේෂ කාර්යන්**

- 2022 – 2024 මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන ධීවර අංශයේ පරිච්ඡේදය සකස් කර අවසන් කිරීම.
- උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා සම්බන්ධීකරණ දායකත්වය ලබා දීම.
- USAID සහ ලෝක බැංකු ආධාර ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම.
- ව්‍යාපෘති වාර්තා ඇගයීමට අදාලව අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනෙකුත් අදාල ආයතන සමග රැස්වීම් 6ක් සංවිධානය කර පැවැත්වීම.
- Aid Memorie, Country Diagnosis Studies (CDS) සඳහා අවශ්‍ය නිරීක්ෂණ ලබා දීම.
- ප්‍රගතිය 2021

| | |
|---|---|
| ලැබුණු ව්‍යාපෘති වාර්තා ගනන | 21 |
| ඇගයීම් කළ ව්‍යාපෘති වාර්තා ගනන | 21 |
| ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ ගනන | 05 |
| නිරීක්ෂණ ලබා දුන් අමාත්‍ය මණ්ඩල සංදේශ ගනන | 05 |

**පරිසර කළමනාකරණය ආපදා කළමනාකරණය**

පාරිසරික ගුණාත්මක බව තහවුරු කරමින් තිරසාර සංවර්ධනයක් කෙරෙහි යොමු වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා නියමිත ආයෝජනයන් සිදු කරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට පහසුකම් සැපයීම පරිසර කළමනාකරණය තුළින් සිදු වේ. තුලිත සමාජ, ආර්ථික හා පාරිසරික භාවිතයන් තුළින් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පාරිසරික කළමනාකරණය ඉතා වැදගත් අවශ්‍යතාවයක් වේ. දූෂණයෙන් තොර පරිසරයක් හා වස-විසෙන් තොර ආහාර රටාවක් තහවුරු කිරීම සඳහා පරිසර ප්‍රතිපත්තිය තුළ හරිත සංවර්ධනය යන සංකල්පය වැදගත් කාර්ය භාරයක් ඉටු කරන අතර, අවම කාබන් පරිහරණයකින් යුතු පිරිසිදු හරිත පරිසරයක් ළඟා කර ගැනීම, පරිසර දූෂණය අවම කිරීම, ඉහළ ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සේවා, පාරිසරික අවදානම අඩු කිරීම, කාර්යක්ෂම සහ තිරසාර සම්පත් පරිභෝජනය තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම, පාරිසරික ගුණාත්මක බව ඉහළ නැංවීම සහ ස්වාභාවික උපද්‍රවයන්ගේ බලපෑම් අවම කිරීම යන කරුණු කෙරෙහි පරිසර කළමනාකරණ අංශයේ අවධානය යොමු වී ඇත. එබැවින් සංවර්ධන සැලසුම්කරණයේදී පාරිසරික සමතුලිතතාවය පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වන ජෛව විවිධත්වය සංරක්ෂණය හා පරිසර පද්ධති පිළිබඳ නිසි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

එසේම ශ්‍රී ලංකාව ස්වාභාවික විපත්වලට ලක් වීමේ ප්‍රවණතාවය ඉහළ අතර, එය මිනිස් ජීවිත හා දේපළ වලට දැඩි හානි සිදු කිරීමට හේතු වී ඇත. තවද රටේ ආර්ථික සංවර්ධනය සඳහා මානව සම්පත සෘජු දායකත්වය සපයන බැවින්, රටේ ජනතාව අපදාවන්ගෙන් බේරා ගැනීම අතිශය වැදගත් කාර්යයක්ව පවතී. එබැවින්, රට තුල ස්වාභාවිකව හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වන ආපදාවන්, ඵලදායී ලෙස වළක්වාගැනීම හා පාලනය කිරිම තුළින් ඔවුන්ගේ ජීවිතවල සමගිය, සමෘද්ධිය සහ අභිමානය සඳහා පහසුකම් සලසමින් ප්‍රජාව රැකබලා ගැනීම සඳහා රජය තිරසාර හා කඩිනම් පියවර ගෙන තිබේ.

**විශේෂ අවස්ථා**

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 30ක් ඇගයීමට ලක් කිරීම.
- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 23 ක් සඳහා නිරීක්ෂණ සැපයීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021 - 2024 සකස් කිරීමට සහාය ලබාදීම
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම

## 2.3 මාර්ග, වරාය, ගුවන් සේවා, ප්‍රවාහන, විදුලිබල හා බලශක්තිය, ජල හා සනීපාරක්ෂක සේවා

**ප්‍රවාහන, මහාමාර්ග, වරාය, ගුවන් සේවා සහ ජල සම්පාදන**

රට තුළ සහ රටින් පිටත කාර්යක්ෂමව මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීම ප්‍රවාහනයට සම්බන්ධ අංශවල ප්‍රධාන කාර්යය වේ. අධිවේගී මාර්ග සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම සහ පුනරුත්ථාපනය කිරීම, මාර්ග නඩත්තු කිරීම සහ පාලම් ඉදිකිරීම, නවීකරණය තුළින් පොදු ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම, නාගරික ග්‍රාමීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම, නාගරික වාහන තදබදය අවම කිරීම, මාර්ග අනතුරු අවම කිරීම සහ වරාය සහ ගුවන් තොටුපළ පුළුල් කිරීම ඇතුළු මාර්ග සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම. යටිතල පහසුකම් සහ පහසුකම් 2021 වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. මීට අමතරව, ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශයට ' සැමට ජලය' වැනි ප්‍රධාන ජල සම්පාදන වැඩසටහන් සහ සමහර සනීපාරක්ෂක ව්‍යාපෘති ඇත.

**විශේෂිත වූ කාර්යයන්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති හා වැඩසටහන් 35 ක් ඇගයීම.
- මහාමාර්ග අමාත්‍යාංශය, ප්‍රවාහන අමාත්‍යාංශය, වරාය හා නාවික අමාත්‍යාංශය, ජල සම්පාදන අමාත්‍යාංශය හෝ මාර්ග, ප්‍රවාහන, වරාය, ගුවන් සේවා සහ ජල සම්පාදන සම්බන්ධ කැබිනට් සංදේශ ඉදිරිපත් කළ ඕනෑම අමාත්‍යාංශයක් විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ හා ප්‍රතිපත්ති පත්‍රිකා පිළිබඳ නිරීක්ෂණ සකස් කිරීම. කැබිනට් සංදේශ සඳහා මුළු කැබිනට් නිරීක්ෂණ 48 ක් ඉදිරිපත් කරන ලදී.
- ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීමේදී අදාළ අමාත්‍යාංශවලට තාක්ෂණික යෙදවුම් ලබා දීම.
    - පහත සඳහන් කමිටු වල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
        - සනීපාරක්ෂක ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම සහ අංක 2- 1974 NWSDB ජල පනත සංශෝධනය කිරීම.
        - බස් ගාස්තු සංශෝධනය කිරීම සහ බස් බලපත්‍ර නිකුත් කිරීම
        - ව්‍යාපෘති මෙහෙයුම් කමිටු
- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් සඳහා අදහස් දැක්වීම.

**විදුලිබල හා බලශක්තිය අංශය**

විදුලිබල හා බලශක්ති අංශය විදුලිබල සහ ඛනිජ තෙල් කර්මාන්ත නියෝජනය කරයි. බොර තෙල් සහ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා, වාර්ෂිකව රු. මිලියන 500,000 වැය කරනු ලැබේ. දැනට පවත්නා මුළු විදුලි උත්පාදනය සහ රටේ ස්ථාපිත ධාරිතාව පිළිවෙලින් ගිගාවොට් පැය 15,720 සහ මෙගාවොට් 4,265 කි. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල විදුලි පරිභෝජනය සැලකීමේදී එය කිලෝවොට් 652 kW/h වන අතර, රටේ වාර්ෂික විදුලි ඉල්ලුම 5.5% ක ප්‍රතිශතයකින් ඉහළ යනු ලැබේ.

ජාතික ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ දැක්ම"ට අනුව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මගින් විදුලි උත්පාදන දිරි ගන්නවන අතර එය විදුලි ජනන මිශ්‍රණයට ඒකාබද්ධ කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. මෙම සන්දර්භය තුළ, පවතින බලශක්ති මිශ්‍රණයට අඩු වියදම් සහ විශ්වාසනීය අනෙකුත් පිරිසිදු බලශක්ති ප්‍රභවයන් දිරිමත් කරන අතරම පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා සමස්ත විදුලි ජනනයෙන් සියයට 70ක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. එබැවින් බලශක්ති හා බලශක්ති ක්ෂේත්‍රයේ වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීමේ මෑත කාලීන ප්‍රවණතාව රජය විසින් ද ප්‍රවර්ධනය කර ඇත. ඒ අනුව, විදුලිබල උත්පාදන ප්‍රභවයන් ගල් අඟුරු, ස්වාභාවික වායු, ජල හා තෙල් වැනි සම්ප්‍රදායික ප්‍රභවයන්ගේ සිට සූර්ය, සුළං, සාගර තරංග, භූතාපජ හා ජෛව ස්කන්ධ වැනි සම්ප්‍රදායික නොවන ප්‍රභවයන් දක්වා විහිදේ. මෙම අංශයේ "කාබන් මධ්‍යස්ථභාවය" උල්ලංඝනය නොකර විදුලිබල හා බලශක්ති අංශය සංවර්ධනය කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ද පූර්ණ සහයෝගය ලබා දී ඇත. 2021 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙ හි දායකත්වය පහත පරිදි සාරාංශගත කළ හැකිය.

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘති යෝජනා 36 ක් ඇගයීමට ලක් කර නිරීක්ෂණ ලබා දී ඇත.
- "ජාතික ඩෙකාබරයිසේෂන් ප්‍රතිපත්තිය" (National Decarburization Policy), "පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ප්‍රතිපත්ති පරමාර්ථය" සහ න්‍යෂ්ටික තාක්ෂණය සාමකාමීව යෙදවීම පිළිබඳ ද්විපාර්ශ්වික ගිවිසුම පිළිබඳ කැබිනට් සංදේශය ඇතුළුව කැබිනට් සංදේශ 09 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.
- විදේශ දූත මණ්ඩලවලට අදාළ කරුණු පිළිබඳව නිරීක්ෂණ ලබා දීම.
- ගෑස් භාවිතයේ ප්‍රධාන සැලැස්ම (Gas Utilization Master Plan) පිළිබඳ කමිටුවල කටයුතු කිරීම.
- ආසියාවේ සහ පැසිෆික් කලාපයේ අවම කාබන් සංක්‍රාන්තියට සහාය වන බලශක්ති ප්‍රතිපත්තිය පිළිබඳ වැඩි දියුනු කිරීම සඳහා කරුනු දැක්වීම (Energy Policy Supporting Low Carbon Transition in Asia and the Pacific).

## 2.4 නාගරික සංවර්ධන සහ නිවාස

**නාගරික සංවර්ධන හා නිවාස අංශය**

ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් 80% ක් පමණ නගර ආශ්‍රිතව ජනනය වන අතර නාගරික සංවර්ධනය රටක සංවර්ධන මට්ටම සහ ශ්‍රී විභූතිය පිළිබිඹු කරන ප්‍රධාන සාධකයකි. ශ්‍රී ලංකාවේද සංවර්ධනයට සුවිශාල දායකත්වයක් නාගරික ප්‍රදේශ මගින් එක්කරන අතර නාගරික ප්‍රදේශවල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩිදියුණු කරන මනා සංවිධානයකින් යුතුව තිරසර සහ ආකර්ශණීය නාගරික පහසුකම් ස්ථාපනය තුලින් රටේ සංවර්ධනයට නාගරික අංශයේ දායකත්වය ඉමහත් ලෙස ඉහළ නැංවිය හැක. මේ සඳහා ආර්ථික සහ සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම කළමනාකරණ පද්ධතීන් උසස් කරලීම අවශ්‍ය වේ. තවද , පවතින යටිතල පහසුකම්වල උපයෝජනය ඉහළ නැංවීමද අත්‍යාංශ්‍ය වේ.

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තිය තුල නාගරික විෂමතාවයන් අඩු කිරීම සහ නගරවල ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතරම හරිත නගර, සුහුරු නගර සහ සිරස් නගර ආදී නූතන නාගරික සංවර්ධන සංකල්ප මත පදනම්ව තිරසර සහ අන්තර් සම්බන්ධිත නාගරික සංවර්ධනයක් උදෙසා අවශ්‍ය ප්‍රතිපත්තිමය මග පෙන්වීම් සිදුකර ඇත.

රටේ පවුල් මිලියන 6ක් අතරින් කිසියම් ආකාරයක නිවසක් ඇත්තේ මිලියන 5.2ක් සඳහා පමණි. එබැවින්, තමන්ගේ ම නිවසක් නොමැති පවුල් සංඛ්‍යාව 800,000 ඉක්මවයි. එසේම, වර්තමාන නිවාස සංඛ්‍යාවෙන් 300,000කට ආසන්න ප්‍රමාණයක් තාවකාලික එකලස් කිරීම් බැවින් මෙම ගැටළුව තවදුරටත් තීව්‍ර වී තිබේ.
අවශ්‍ය පරිදි මෙ අංශයේ තාක්ෂණික මහපෙන්වීම යටතේ සකස් කරන ලද අදාල ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් සුදුසු වැඩසටහන් සහ ව්‍යාපෘති හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය සහ දායකත්වය ලබාදී ඇත.

**ක්‍රියාකාරකම්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 15ක් සඳහා නිරීක්ෂණ සැපයීම
- නාගරික සංවර්ධනය හා නිවාස සම්බන්ධ ව්‍යාපෘති යෝජනා 107ක් ඇගයීමට ලක් කර අවශ්‍ය කටයුතු සඳහා යොමු කිරීම
- ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල වෙනස්කම් සිදුකිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම
- ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවලට සහභාගී වීම
- විදේශ ආධාර ලබාදෙන ආයතන මගින් මූල්‍යනය සිදු කරන ව්‍යාපෘති සම්බන්ධයෙන් එම ආයතන සමඟ අදාල පරිදි කටයුතු කිරීම
- ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගී වීම
- ව්‍යාපෘති /ආංශික සංවර්ධනය සම්බන්ධයෙන් වාර්තා සකස් කිරීම
- ජාතික සහ ආංශික ප්‍රතිපත්ති සකස්කිරීමට දායකවීම

## 2.5 සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය විද්‍යාව, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ හා සමාජ ආරක්ෂණය

**සෞඛ්‍ය අංශය**

කොවිඩ් 19 වෛරසය පාලනය හා එය සමාජගත වීම වැලැක්වීම මෙම වර්ෂය තුලදී රජයේ මූලික අභිමතාර්ථයක් විය. ඒ අනුව රජය විසින් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය වැනි ආධාර සපයන ආයතන හා එක්ව එන්නත් මිලදී ගැනීම, එන්නත් ලබා දීම සඳහා වන භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම වැනි කටයුතු සිදු කරමින් කොවිඩ් 19 වෛරසය සඳහා මෙරට ප්‍රතිචාරය ශක්තිමත් කිරීම සඳහා සුවිශාල ආයෝජනයක් සිදු කරන ලදී. තවද, රජය විසින් 2021-2022 වර්ෂයන් සඳහා රුපියල් මිලියන 23,000ක මුදලක් 2021 අයවැය මඟින් සෞඛය අංශය සඳහා වෙන් කරනු ලැබිනි. 2021 වර්ෂයේදී එයින් රුපියල් මිලියන 10,000ක් දිවයින පුරා විහිදී ඇති මාතෘ හා ළමා සායන, ඩිස්පෙන්සරි, වැඩිහිටි සේවා මධ්‍යස්ථාන, රසායනාගාර සේවා, සෞඛ්‍ය සේවා ස්ථාන හා පර්යේෂණ ආයතන පුළුල් කිරීම සඳහා වෙන් කෙරුණි. මීට අමතරව තවත් රුපියල් මිලියන 5000ක් ග්‍රාමීය රෝහල්, ඩිස්පෙන්සරි හා මාතෘ සායන වැඩිදියුණු කිරීම සඳහා 2021 අයවැය මඟින් වෙන් කරනු ලැබු අතර එම අරමුදල් අදාල පළාත් සභා සඳහා සම්බන්ධීකරණ කටයුතු මුදල් කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබිනි.

ක්‍රියාකාරකම්

- ව්‍යාපෘති යෝජනා 34 ඇගයීම් සිදු කර ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත. ඊට අදාල නිරීක්ෂණ අදාළ රේඛීය අමාත්‍යාංශය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- සෞඛ්‍ය අමාත්‍යාංශය ,ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය සඳහා වන රාජ්‍ය අමාත්‍යාංශය හා දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 07 සඳහා නිරීක්ෂණ සපයා ඇත.
- සෞඛ්‍ය අංශය සඳහා ඉදිරි වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනා වී ඇති ව්‍යාපෘති සලකා බලා ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක වන විදේශ ආධාර සපයන ව්‍යාපෘති වලට අදාලව රැස්වීම් පවත්වා අදාල නිරීක්ෂණ/ ලෝක සෞඛ්‍ය සංවිධානය , ලෝක බැංකුව , ආසියානු සංවර්ධන බැංකුව වැනි මූල්‍ය ආධාර සපයන ආයතන වල නියෝජිතයන් වෙත ඉදිරිපත් කිරීම.

### අධ්‍යාපන අංශය, උසස් අධ්‍යාපන අංශය, නිපුණතා අධ්‍යාපන අංශය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය

**අධ්‍යාපන අංශය**

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සිසුන්ගේ ප්‍රවේශය සැලකීමේදී රටේ අධ්‍යාපන ප්‍රවේශය ඉහළ මට්ටමක පවතින අතර එය සංවර්ධිත රටවලට සමාන අගයක් ගනී. මේ වන විට වැඩිහිටි සාක්ෂරතාවය සියයට 91.7 දක්වා ඉහළ ගොස් ඇති අතර රටෙහි ප්‍රාථමික

අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමේ අනුපාතය සියයට 99.11 ක් වේ. 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාව මානව සංවර්ධන දර්ශකයේ (HDI) 0.782 ක අගයක් ලබා ගනිමින් 72 වැනි ස්ථානයට පත්විය. ශ්‍රී ලංකාවේ අගය ඉහළ මානව සංවර්ධන දර්ශක ඇති රටවල සාමාන්‍යය අගය (0.753) සහ දකුණු ආසියාවේ රටවල සාමාන්‍යයට (0.641) වඩා වැඩි වේ. මේ වන විට රජයේ පාසල් 10,175 ක සිසුන් 4,214,000 ක් පමණ සිටින අතර ගුරුවරු 247,000 ක් පමණ සිටිති. ඊට අමතරව රජයේ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක වන රජයේ අනුමත පෞද්ගලික පාසල් 81 ක්, විශේෂ අධ්‍යාපන පාසල් 25 ක් සහ පිරිවෙන් 749 ක් ද ඇත. රජයේ පාසල් වල ශිෂ්‍ය සහ ගුරුවරු අනුපාතය 16: 1 ලෙස පවතී.

**ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති;**

- දැනට පවතින පාසල් අතර තෝරාගත් පාසල් උසස් කිරීමෙන් ජාතික පාසල් සංඛ්‍යාව 1000 දක්වා වැඩි කිරීම සහ නව ත්‍රෛභාෂා ද්විතීයික ජාතික පාසල් 20 ක් පිහිටුවීම
- ලෝක බැංකුව විසින් අරමුදල් සපයන සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
- පළාත් හා කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම
- ප්‍රාථමික පාසල් 3577 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- තාක්ෂණ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය
- වතු පාසල් ද්විතීයික මට්ටමට උසස් කිරීම

**2021.12.31 වන විට ප්‍රගතිය**

| | ලැබුණු ගණන නිර්දේශිත | නිර්දේශිත ඉදිරිපත් කළ ගණන |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනා | 10 | 10 |
| කැබිනට් සංදේශය සඳහා නිරීක්ෂණ | 05 | 05 |
| කැබිනට් සංදේශය සඳහා අදහස් | 02 | 02 |

**රැස්වීම් වලදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම -** අධ්‍යාපන අංශය හා සම්බන්ධ මෙහෙයුම් කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ අයවැය සාකච්ඡා සඳහා සහභාගීවීම.

**උසස් අධ්‍යාපන**

නව විශ්ව විද්‍යාල පිහිටුවීම සහ බොහෝ රාජ්‍ය විශ්ව විද්‍යාල සඳහා නව පීඨ සහ ගොඩනැගිලි ස්ථාපිත කිරීම තුළින් උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථා වැඩි වශයෙන් සලසා දීමෙන් 2021 වසර තුළ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් ලෙස ව්‍යාප්ත විය. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අධීක්ෂණය යටතේ සමස්ත උසස් අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය විශ්වවිද්‍යාල 17ක් දක්වා ද උසස් අධ්‍යාපන ආයතන 20ක් දක්වා ද ඉහළ ගොස් ඇත. එය 2010 සිට 2020 දක්වා කාලය තුළ විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව 19,739 කින් වැඩි වීමට හේතු වී ඇත.

2021 වර්ෂය තුළ දී රාජ්‍ය විශ්ව විද්‍යාලවල යටිතල පහසුකම් එනම් දේශන ශාලා, නේවාසිකාගාර, පුස්තකාල, විද්‍යාගාර සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම වැනි

ඉදිකිරීම් සිදු කිරීමටත් උපාධි පාඨමාලා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහාත් ප්‍රතිපාදන වශයෙන් රුපියල් බිලියන 80.27ක් වෙන් කර ඇත. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය සහ වවුනියාව විශ්ව විද්‍යාලය නමින් නව විශ්ව විද්‍යාල දෙකක් පිහිටුවීම සහ ශ්‍රී ලංකාව සහ විදේශීය විශ්ව විද්‍යාල කිහිපයක් අතර පර්යේෂණ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් කිහිපයකට අත්සන් තැබීම ඇතුළු ව්‍යාපෘති යෝජනා 34 ක් සිදු කර ඇත. තවද, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ ක්ෂේත්‍රයන් සඳහා විදේශීය පරිත්‍යාගශීලීන්ගෙන් ලද පර්යේෂණ ප්‍රදානයන් වඩාත් ගුණාත්මක උපාධිධාරීන් බිහිකිරීමට සහ උපාධි පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් නිර්දේශ කිරීම සිදු කර ඇත. තවදුරටත් 2021 වර්ෂය තුළදී, රටේ සිසුන්ට උසස් අධ්‍යාපනයට ප්‍රවේශය පුළුල් කිරීමේ අරමුණින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විධිමත් කිරීම සහ මෙම ආයතන පුලුල් කිරීම සඳහා බොහෝ පියවරයන් රැසක් ගන්නා ලදී.

*ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්*

- උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධ නව ව්‍යාපෘති සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වීම
- විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති වල දූත කණ්ඩායම් සමග පැවැත්විය යුතු සාකච්ඡා සංවිධානය හා මෙහෙය වීම සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම
- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ නව ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම
- උසස් අධ්‍යාපන අංශය සම්බන්ධයෙන් ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශ 28 ක් සහ ව්‍යාපෘති යෝජනා 34 ක් නිර්දේශ කිරීම

**නිපුණතා අධ්‍යාපනය**

රට තුළ ජාතික, ආර්ථික සහ සමාජීය සංවර්ධන ක්‍රියාවලියේදී ඉහළ නිපුණතා සහ නිපුණ ශ්‍රම බලකායක් සිටීමේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇත. එය සැලකිල්ලට ගනිමින්, ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා කුසලතා සංවර්ධනයේ පරිවර්තනීය අවධියක් ප්‍රකාශ කිරීම සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් රජය විසින් 2021-2030 "නිපුණතා සංවර්ධනයේ දශකයක්" ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. ඒ අනුව, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (TVET) සඳහා ප්‍රවේශය වැඩි කිරීමට මුල පිරීම් කිහිපයක් ගෙන ඇති අතර, පුහුණු අපේක්ෂකයින්ට කුසලතා ලබා ගැනීමට සහ ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුමක් ඇති තමන් කැමති වෘත්තීන්හි නිපුණත්වය ලබා ගැනීමට TVET පද්ධතියට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දී ඇත.

**නිම කරන ලද කාර්යයන්**

- නිපුණතා සංවර්ධන අංශයට අදාළව ඇගයීම සඳහා ව්‍යාපෘති යෝජනා 15ක් ලැබී ඇත. ඉන් නිසියාකාරව සාධාරණීය කර ඇති ඇගයීම් වාර්තා 08 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට/ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය ආයතන වෙත ඉදිරිපත් කර ඇත.
- නිපුණතා අධ්‍යාපන අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 12ක් සඳහා නිරීක්ෂණ සකස්කිරීම.
- නිපුණතා සංවර්ධන අංශයට අදාළව අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් සංවිධානය කිරීම.

## තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

විසි එක්වන සියවස දැනුම කේන්ද්‍රීය වූ සියවසක් ලෙසින් හඳුන්වනු ලබයි. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය වනුයේ තාක්ෂණය පදනම් කරගත් සමාජයක් බිහි කිරීම වන අතර එය ගෝලීය නව්‍යකරණ කේන්ද්‍රය, ජනතාව කේන්ද්‍ර කරගත් ඩිජිටල් රාජ්‍ය තන්ත්‍රයක් බිහි කිරීම, ඩිජිටල්කරණය වූ ශ්‍රී ලංකාවක් බිහි කිරීම සහ තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් බිහි කිරීම තුළින් ගොඩ නැගීමට අපේක්ෂා කරනු ලබයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නව තාක්‍ෂණයන් සඳහා උපායමාර්ගිකව ආයෝජනය කිරීම හා එවැනි නවෝත්පාදනයන් අපේ අධ්‍යාපන ක්‍රමය සහ ආර්ථිකය සමඟ ඒකාබද්ධ කිරීම කාලීනව අවශ්‍ය වේ. ''ජාතික ඩිජිටල් පරිවර්තන න්‍යායපත්‍රය'', තාක්ෂණික හා සංවර්ධන අංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල කාර්යභාර්යයක් ඉටු කිරීම සඳහා පාර්ශ්වකරුවන්ට හිතරක පරිසරයක් නිර්මාණය කරනු ලබයි. නව තාක්ෂණ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයින්ට හිතකර පරිසරයක් නිර්මාණය කරමින් අපනයන ආදායම ඉහළ නැංවීමට සහ ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය ලෝකයේ නැගී එන ගමනාන්තයක් ලෙස වැඩිදියුණු කිරීම රජයේ අරමුණයි.

## නිම කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති යෝජනා 15ක් ඇගයීම සඳහා ලැබුණු අතර ඉන් 10 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරන ලදී.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 04 ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම.
- අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් සංවිධානය කිරීම.

## සමාජ ආරක්ෂණ අංශය

"සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති රාමුව අනුව, රජයේ සමස්ත සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය වනුයේ සමාජයේ ජීවත් වන වරප්‍රසාද නොලත් අත්‍යවශ්‍ය සියළුම ජන කොටස් සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවමින් හා සවිබල ගැන්වීම මඟින් රටේ සංවර්ධන ප්‍රවේශයට අනුගත කිරීම සඳහා ඉලක්ක කර ගත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රියාත්මක කිරීම වේ.සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය ළමයි, අවාසි සහගත කාන්තාවන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් ඇතුළුව අවදානමට ලක්විය හැකි කොටස් වල යහපැවැත්ම සහතික කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන අමාත්‍යාංශ වේ.

**2021.12.31** දිනට ප්‍රගතිය

- **ව්‍යාපෘති යෝජනා සඳහා තක්සේරු වාර්තා සකස් කිරීම සහ කැබිනට් පත්‍රිකාවලට නිරීක්ෂණ සකස් කිරීම**

| | ලැබුණු සංඛ්‍යාව | නිර්දේශිත/ ඉදිරිපත් කළ සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනා | 10 | 10 |
| කැබිනට් සංදේශය සඳහා නිරීක්ෂණ | 03 | 03 |
| කැබිනට් සංදේශය සඳහා අදහස් | 02 | 02 |

- **නිර්දේශය ඉදිරිපත් කිරීම-** ජාතික සමාජ ආරක්ෂණ තක්සේරු අවසන් වාර්තාව, ජාතික සමාජ ආරක්ෂණ උපාය මාර්ග කෙටුම්පත සහ මුල් ළමාවිය සංවර්ධන (ECD) වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ නිර්දේශ ලබා දෙන ලදී.

- **ප්‍රතිපත්ති සමාලෝචනය හා තක්සේරු කිරීම -** පහත සඳහන් ප්‍රතිපත්ති සමාලෝචනය කර නිරීක්ෂණ ලබා දෙන ලදී.
  - COVID - 19 සැලැස්ම
  - ජාතික සමාජ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති රාමුව

- **පහත වාර්තා පිළිබඳ අදහස් ලබා දෙන ලදී.**
  - "ශ්‍රී ලංකාවේ දිගු කාලීන සත්කාර පිළිබඳ 2020 ජූනි මස අධ්‍යයනය"
  - ස්ත්‍රී පුරුෂ භාවය සහ කම්කරු විශේෂඥ භාවය තුලින් COVID-19 වෙතින්වූ බලපෑම යතාවත් කිරීම සඳහා ජාතික සංවර්ධන සැලසුම්වලට සහාය වීම (දින 66, මාස 4ට වැඩි, කඩින් කඩ)
  - කෙටුම්පත: ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාව ක්‍රමානුකූලව විනිශ්චය කිරීම (SCD)

- **රැස්වීම් හා වැඩමුළු වලදී ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම -** සමාජ ආරක්ෂණ අංශයේ අදාළ රේඛීය ආයතන විසින් පවත්වන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් හා ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගී වී සමාජ ආරක්ෂණ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සහාය ලබා දුන්නේය.

## 2.6 රාජ්‍ය කළමනාකරණය සහ පාලනය, සංස්කෘතික හා ආගමික කටයුතු

### පාලන හා රාජ්‍ය කළමනාකරණ අංශය

රාජ්‍ය පරිපාලනය, මහජන ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, මාධ්‍ය , අධිකරණ, විදේශ සබඳතා , සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පාලන හා රාජ්‍ය කළමණාකරණ අංශය යටතේ සලකා බලනු ලබන ප්‍රධාන සංරචකයන් වේ. මෙයට අමතරව ස්වාධීන කොමිෂන් සභා හා විශේෂ වියදම් ඒකකය ද මෙම අංශය යටතට ගැනේ.

2021 වර්ෂයේ දී පාලන හා රාජ්‍ය කළමණාකරණ අංශය විසින් මෙරට කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හා නීතිය ක්‍රියාත්මක වන සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම පිණිස රජයේ ජාතික ආර්ථික ප්‍රතිපත්තිය මගින් ප්‍රකාශිත අරමුණු හා ක්‍රමෝපායන් පදනම්ව වැදගත් කාර්යභාරයක් ඉටු කොට ඇත.

ඒ අනුව ව්‍යාපෘති ඇගයීමේ දී අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණය ලබා දීමේ දී මෙන්ම මධ්‍යකාලීන අයවැය රාමුව සකස් කිරීමේ දී ද තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම අරමුණ කොට ක්‍රියාත්මක වී ඇත. එසේම නව තාක්ෂණය සබැඳි මහජන මිත්‍රශීලි රාජ්‍ය සේවයක් ගොඩනැඟීම , ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සුරැකීම, මිත්‍රශීලි නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, වංචාවෙන් හා දූෂණයෙන් තොර රටක් බිහි කිරීම , හා රාජ්‍ය සේවය තුළ වගවීම තහවුරු කිරීම අරමුණු කොට ක්‍රමසම්පාදන ක්‍රියාවලිය ඉටු කොට ඇත.

ඉහත දැක්වූ පදනම් මත එම අංශය විසින් 2021 වර්ෂයේ දී පහත කාර්යයන් සපුරා ඇත.

- රජයේ අරමුදල හෝ විශේෂ අරමුදල මගින් මූල්‍යායන කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා 207ඇගයීමට ලක් කිරීම
- විවිධ අමාත්‍යාංශ යටතේ ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ 53 සඳහා නිරීක්ෂණ විචාර ලබා දීම
- අංශයේ විෂය පථය යටතේ මෙහෙයුම් කමිටු ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ව්‍යාපෘති පිළිබඳ වැඩිදුර සාකච්ඡා සංවිධානය කිරීම හා සහභාගී වීම
- අදාළ අමාත්‍යාංශ විසින් සකසනු ලබන ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැලසුම් 01 හා ක්‍රියාකාරී

## 2.7 ශ්‍රමික කටයුතු

**ශ්‍රමික අංශය**

ශ්‍රමය යනු නිෂ්පාදන සාධක හතරෙන් එක වැදගත් සාධකයක් වන අතර භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා පුද්ගලයකු ශාරීරික, මානසික හා සමාජයීය වශයෙන් දරන උත්සාහයේ මිනුමකි. ආර්ථිකයේ සමස්ත ඵලදායිතාව ශ්‍රමයේ ගුණාත්මකභාවය මත තීරණය වේ. වෙහෙස මහන්සි වී වැඩ කරන සේවකයෙකු බිහි කිරීමේ අපේක්ෂාවෙන් "ඵලදායි පුරවැසියෙක් සහ ප්‍රතිපත්තිය ප්‍රීතිමත් පවුලක්" යන සංකල්පය මත "රට වෙනුවෙන් වැඩ කරන" සංස්කෘතියක් ඇති කිරීම සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් අපේක්ෂා කරයි. රටක ආර්ථිකයේ ගතිකභාවය කායික හා මානසික සෞඛ්‍යයෙන් හා යහපත් සමාජානුයෝජනයෙන් යුත් ශ්‍රම ඵලදායිතාව මත රඳා පවතී. කෙසේ වෙතත්, නිෂ්පාදන ක්‍රියාවලියේ සීඝ්‍රවත් වර්ධනයක් ලබා කිරීමට හා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය සහ දැනුම පදනම් කරගත් කාර්මික පරිසරයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කළ යුතුය. එබැවින්, කර්මාන්ත සඳහා සුවිශේෂී තාක්ෂණික බුද්ධිමතුන් ආකර්ෂණය කර ගැනීමට වැඩි උත්සාහයක් දැරිය යුතුය.

කම්කරු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සලකා බලමින් නිරීක්ෂණ ලබා දීම අංශයේ නිලධාරීන්ගේ ප්‍රධාන දායකත්වය වේ. ඒ අනුව, 2021 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 2 ක් ඇගයීමට ලක්කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය නියෝජිතායතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කම්කරු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 2ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- කම්කරු අංශයේ අදාළ තොරතුරු සහ දත්ත ලබා දීමෙන් රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021-2024 සකස් කිරීමට සහාය වීම.

## 2.8 තරුණ, ක්‍රීඩා කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධනය

**තරුණ කටයුතු අංශය**

සමස්ත ජනගහනයෙන් හතරෙන් එකක් වන ජව සම්පන්න තරුණ ජනගහනය තිරසර සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීයව දායක කරගැනීම අත්‍යාවශ්‍ය වේ. ඔවුන්ගේ අභිලාෂයන් හඳුනාගනිමින් ඒ සඳහා නිශ්චිත හා ස්ථිර වැඩපිළිවෙළක් සකස් කිරීමෙන් තෘප්තිමත් තරුණ පරපුරක් බිහිකිරීම අභිප්‍රාය වේ. ඒ සඳහා දේශපාලන තීන්දු තීරණ ගැනීමේදී හා රාජ්‍ය පාලනයේදී සක්‍රීය දායකත්වය ලබාගැනීම, තරුණ ව්‍යවසායකයින් වෙත ආර්ථික යාන්ත්‍රණය හැසිරවීමේ වගකීම ලබාදීම, තරුණ ආයෝජන පහසු කරවීම සඳහා අරමුදලක් ඇති කිරීම, රාජ්‍ය, පෞද්ගලික හා විදේශීය රැකියා අවස්ථා සඳහා ගැළපෙන තරුණ පරපුරක් ඇති කිරීම ඉලක්ක වී ඇත.

**ක්‍රීඩා අංශය**

ක්‍රීඩාව තාරුණ්‍යයේ ජවය වේ. ජව සම්පන්න, නීරෝගීමත් සහ විනයගරුක සමාජයක් බිහිකිරීම සඳහා ක්‍රීඩාව අත්‍යවශ්‍ය අංගයක් බවට පත් සමාජයක් බිහි කිරීම අපේක්ෂා කෙරේ. එහිදී, පාසල් මට්ටමේ සිට ක්‍රීඩාශීලීත්වය හුරු කිරීම, විශේෂ ක්‍රීඩා කෞශල්‍යයන්ගෙන් යුත් දරුවන් හඳුනා ගෙන ඔවුන් ජාත්‍යන්තරය දක්වා ගෙන යාම, ක්‍රීඩා අධ්‍යාපනය සඳහා උසස් අධ්‍යාපන අවස්ථා ලබාදීමට ක්‍රීඩා විශ්ව විද්‍යාලයක් ඇති කිරීම, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ක්‍රීඩා උපදේශකයින්, පුහුණුකරුවන් හා භෞත චිකිත්සකයින් බිහිකරීමේ වැඩපිළිවෙළක් හඳුන්වා දීම හා වෙළඳ පොළ තුළ ක්‍රීඩා භාණ්ඩ හා අදාළ මෙවලම් සුළභ කිරීම, ක්‍රීඩා අධ්‍යාපන ආධාර ලබාදීම, ක්‍රීඩා තරඟ මෙරට පැවැත්වීම සඳහා රාජ්‍ය අනුග්‍රහ ලබාදීම අපේක්ෂා කෙරේ.

ක්‍රීඩා හා තරුණ කටයුතු අංශයට අදාළ ව්‍යාපෘති යෝජනා 17 ක් ඇගයීම සිදුකොට අවශ්‍ය නිර්දේශ, ජාතික අයවැය දෙපාතමේන්තුව හා අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී. රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී. 2021 – 2024 කාල රාමුව සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලින කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු ක්ෂේත්‍රයට අදාළ තොරතුරු ලබාදෙමින් සහය වීම හා තිරසාර සංවර්ධන අභිමාතාර්ථ 2030 වැඩසටහන සඳහා ආංශික යෙදවුම් (Sectorial Input) ලබා දීම සිදු කරන ලදී.

**ප්‍රාදේශීය සංවර්ධන අංශය**

දිළිඳුකම පිටුදැකීමටත්, පවත්නා ප්‍රාදේශීය විෂමතාවන් අවම කරමින්, ප්‍රදේශයේ පවත්නා සුවිශේෂතාවන් හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්වය ඉහළ නැංවීම උදෙසා, අංශයට අදාළ ප්‍රතිපත්තිමය කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය යෙදවුම් (policy inputs) ලබා දීම සිදුකරයි. තවද, ආංශික හා මධ්‍යකාලීන සැලසුම් සැකසීම, ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘති පෙළ ගැස්ම සැකසීම ආදී කටයුතු ද ඉටු කරනු ලබයි.

ප්‍රාදේශීය සංවර්ධනයේදී, ගම හුදකලා කර සංවර්ධනය කරනවා වෙනුවට ගම සමග ප්‍රදේශ සම්බන්ධ කර කලාපයක් ලෙස සංවර්ධනය කිරීමත්, එලෙස සංවර්ධනය වූ කලාප අගනගර හා සම්බන්ධ කළ යුතු බව වර්තමාන සංවර්ධන ප්‍රතිපත්ති තුළින් අවධාරණය කර ඇත.
ඒ අනුව, ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා, ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනීමේ වැදගත්කම මෙම අංශය මගින් අවධාරණය කෙරේ.

එමෙන්ම, පළාත් 9 තුළ පවතින ආර්ථික වර්ධන වේගය, මානව සංවර්ධන දත්ත, සමාජ දත්ත හා ඒවායේ කාලීන වෙනස්කම් විශ්ලේෂණය කිරීමේදී පළාත් 9 හි මූලික සංවර්ධන ගැටළු, විෂමතා, අභියෝග හා ශක්තීන් පිළිබඳව අනාවරණය කර ගත හැකි වේ.
ඒ තුළින් ප්‍රදේශයේ කෘෂිකාර්මික, කාර්මික, යටිතල පහසුකම්, මානව සම්පත් සංවර්ධන යන ක්ෂේත්‍රවල පවත්නා හිඩැස පිරවීමට අවශ්‍ය යෙදවුම් ලබාදීම.

## 2.9. ප්‍රාදේශීය සංවර්ධන අංශය

### 01. විමධ්‍යගත අයවැය වැඩසටහන- 2021

විමධ්‍යගත අයවැය වැඩසටහන 2021 ක්‍රියාත්මක කිරීම සඳහා එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට රුපියල් මිලියන 10 බැගින් රුපියල් මිලියන 2,250 ක් වෙන් කෙරුණි. 2021.12.31 වන දින වන විට දිසත්‍රික් ලේකම්වරු විසින් යොමුකරන ලද රුපියල් මිලියන 2,232.43 ක වටිනාකමින් යුතු චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාත්මක කළ හැකි සංවර්ධණ යෝජනා 30,767 ක් අනුමත කර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සමග ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරු වෙත යොමුකර ඇත.

දිස්ත්‍රික් මට්ටමින් වාර්තාකර ඇති ප්‍රගතිය හා අනුව 2021.12.31 දිනට රුපියල් මිලියන 2,115.65 ක වටිනාකමින් යුතු (අතැති බිල්පත් වටිනාකම සමග) ව්‍යාපෘති 30,193 ක වැඩ අවසන් කර ඇත. දිස්ත්‍රික්ක අනුව තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | භෞතික ප්‍රගතිය | | | මූල්‍යමය ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | % | නිදහස් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | නිම කරන ලද වැඩවල මුළු වටිනාකම (රු.මි.) | % |
| 1 | අම්පාර | 938 | 933 | 99% | 84.04 | 82.65 | 98% |
| 2 | අනුරාධපුරය | 1489 | 1443 | 97% | 90.24 | 84.87 | 94% |
| 3 | බදුල්ල | 1640 | 1578 | 96% | 87.83 | 80.35 | 91% |
| 4 | මඩකලපුව | 418 | 417 | 100% | 54.40 | 53.50 | 98% |
| 5 | කොළඹ | 2380 | 2363 | 99% | 247.79 | 234.96 | 95% |
| 6 | ගාල්ල | 1468 | 1468 | 100% | 96.22 | 87.56 | 91% |
| 7 | ගම්පහ | 1099 | 1087 | 99% | 203.51 | 194.89 | 96% |
| 8 | හම්බන්තොට | 958 | 958 | 100% | 70.82 | 69.89 | 99% |
| 9 | යාපනය | 736 | 736 | 100% | 61.36 | 61.33 | 100% |
| 10 | කළුතර | 687 | 668 | 97% | 134.95 | 128.49 | 95% |
| 11 | මහනුවර | 2138 | 2110 | 99% | 162.21 | 156.11 | 96% |
| 12 | කෑගල්ල | 2470 | 2315 | 94% | 109.59 | 97.70 | 89% |
| 13 | කිලිනොච්චි | 130 | 130 | 100% | 15.04 | 14.90 | 99% |
| 14 | කුරුණෑගල | 4868 | 4840 | 99% | 175.61 | 170.83 | 97% |
| 15 | මන්නාරම | 288 | 287 | 100% | 23.11 | 22.76 | 98% |
| 16 | මාතලේ | 1018 | 1012 | 99% | 51.90 | 51.01 | 98% |
| 17 | මාතර | 1430 | 1407 | 98% | 76.53 | 71.26 | 93% |
| 18 | මොනරාගල | 878 | 870 | 99% | 67.63 | 65.14 | 96% |
| 19 | මුලතිව් | 278 | 278 | 100% | 26.76 | 26.72 | 100% |
| 20 | නුවරඑළිය | 1198 | 1181 | 99% | 82.13 | 75.86 | 92% |
| 21 | පොළොන්නරුව | 844 | 843 | 100% | 50.29 | 49.54 | 99% |
| 22 | පුත්තලම | 1184 | 1178 | 99% | 79.85 | 75.46 | 95% |
| 23 | රත්නපුරය | 1477 | 1340 | 91% | 113.40 | 97.32 | 86% |
| 24 | ත්‍රිකුණාමලය | 481 | 479 | 100% | 41.53 | 41.27 | 99% |
| 25 | වවුනියාව | 272 | 272 | 100% | 21.37 | 21.30 | 100% |
| | **මුළු එකතුව** | **30767** | **30193** | **98%** | **2,228.08** | **2,115.65** | **95%** |

## 02.ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (RIDP)

2021 අයවැය යටතේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (RIDP) වැඩසටහන සඳහා රු. මිලියන 8,000 ක ප්‍රතිපාදන වෙන් කෙරුණු අතර, එමගින් 2020 වර්ෂයේ ක්‍රියත්මක කළ "සපිරි ගමක්" වැඩසටහන් හා 2019 හා 2020 වර්ෂවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වලට අදාළ අතැති බිල්පත් පියවීමට හා අඛණ්ඩ ව්‍යාපෘති 203 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 5,386.55 ක ප්‍රතිපාදන නිදහස් කරන ලදී.

2021.12.31 දිනට මේ වන විට අඛණ්ඩ ව්‍යාපෘති 177 ක වැඩ අවසන් කර ඇති අතර ජාතික ගිණුම් දෙපාර්තමේන්තුවේ වියදම් වාර්ථාව අනුව අතැති බිල්පත් පියවීම හා අඛණ්ඩ ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 5,304.88 ක වියදමක් වාර්තා කර ඇත.

## 03. Promoting Autonomy, Literacy and Attentiveness through Market Alliances (PALAM/A) Project in Sri Lanka

මෙම ව්‍යාපෘතිය යටතේ ආධාර ලෙස මෙරටට ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවිය යුතු විශේෂ වෙළඳ බද්ද ගෙවීම වෙනුවෙන් හා ආහාර ද්‍රව්‍ය වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා 2021 අයවැය යටතේ පහත පරිදි ප්‍රතිපාදන වෙන් වූ අතර ඊට අතිරේකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගත් අතර 2021.12.31 දිනට වියදම පහත වාර්තා කර ඇත.

| වැය ශීර්ෂය | 2021 අයවැය මගින් වෙන්කළ ප්‍රතිපාදන රු. | අතිරේකව ලබා ගත් ප්‍රතිපාදන රු. | මුළු ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 237-1-2-4-2506 (13) | 60,000,000.00 | 805,631,197.61 | 865,631,197.61 | 865,631,197.61 |
| 237-1-2-4-2506 (17) | 20,000,000.00 | 36,000,000.00 | 56,000,000.00 | 55,582,600.00 |

## 2.10 ලෝක ආහාර වැඩසටහන (WFP)

### ආහාර වැඩපිළිවෙල

ලෝක ආහාර වැඩපිළිවෙලේ සහයෝගීත්වය විධිමත් ලෙස ශ්‍රී ලංකාව තුල ස්ථාපනය කර ඇත්තේ 1968 නොවැම්බර් 10 දින මූලික ගිවිසුමකට අත්සන් කිරීමෙන් වන අතර ශ්‍රී ලංකා රජය එහි ක්‍රියාකාරකම් ඉටු කිරීමට කැප වී ඇත. ලෝක ආහාර වැඩපිළිවෙල අදියර කිහිපයක මැදිහත්වීම් මගින් සහය දක්වන්නේ හදිසි අවස්ථාවන්ට සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම, පාසල් ආහාර වැඩසටහන, මධ්‍යස්ථ මන්ද පෝෂණීය තත්වයන් වැළැක්වීම හා කළමනාකරණය කිරීම, දේශගුණික වෙනස් වීම් නිසා ඇති වන කම්පනවලින් යථා තත්වයට පත්කිරීම, ජීවනෝපාය නැංවීමට සහය ලබා දීම, ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම වැනි ක්‍රියාකාරකම් ඉටු කිරීමයි. වර්තමානයේ, 2018 සිට 2022 දක්වා රාජ්‍ය උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන වශයෙන්, තිරසර සංවර්ධන අරමුණුවල අංක 02 හි සඳහන් කුසගින්න තුරන් කිරීමේ අරමුණුවලට අනුගත වෙමිනි. පහත දැක්වෙන නිමවුම් අපේක්ෂිත ප්‍රතිඵල වේ.

- ශ්‍රී ලංකාවේ කාලගුණික හා වෙනත් අර්බුදවලින් පීඩාවට පත් ජනතාව වෙත වසර පුරා ආහාර ලැබීම සඳහා ප්‍රවේශය
- ආහාර අනාරක්ෂිත ප්‍රදේශවල සිටින පාසල් වයසේ දරුවන්ට වසර පුරා ආහාර ලැබීම සඳහා ප්‍රවේශය
- ශ්‍රී ලංකාවේ අවුරුදු 5 ට අඩු දරුවන්ගේ, නව යොවුන් වියේ ගැහැණු දරුවන්ගේ සහ සඵල වයසේ කාන්තාවන්ගේ පෝෂණය 2025 වන විට වැඩි දියුණු කිරීම.
- ශ්‍රී ලංකාවේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල සහ සුළු පරිමාණ ගොවීන්ගේ වසර පුරා ජීවනෝපාය සහ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.

ඉහත ප්‍රතිඵල ලඟා කර ගැනීම සඳහා, 2018-2022 රාජ්‍ය උපාය මාර්ගික සැලැස්ම වාර්ෂික සැලසුම් යටතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මගින් ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව, පහත ක්‍රියාකාරකම් 2021 වසර තුල ක්‍රියාත්මක කර ඇත.

1. ශ්‍රී ලංකාවේ අර්බුදවලින් පීඩාවට පත් ජනතාවට වසර පුරා ආහාර ලැබීම සඳහා ප්‍රවේශය

i. ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, මෝසම් ප්‍රතිචාර සම්බන්ධීකරණ සන්සදය පවත්වා ඔවුන්ගේ වාර්ෂික සැලැස්මේ ආපදා අවම කිරීමට සමගාමීව සහන සැලැසුම් හා ප්‍රතිචාර, කාලීන තොරතුරු සහ කළමනාකරණය සහ ආහාර සුරක්ෂිතතා ක්‍රියාමාර්ග සඳහා තාක්ෂණික යෙදවුම් ලබා දී ඇත. ඒ අතරම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ආපදා සහන මධ්‍යස්ථානය සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එම ආයතන ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික ධාරිතාවය ප්‍රවර්ධනයට වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මුළු වියදම රුපියල් මිලියන 10.22 කි.

ii. ගිනි ගැනීමට ලක් වූ පර්ල් එක්ප්‍රස් නෞකාවෙන් හානියට පත් වූ ධීවරයින් 2,641 ක් සඳහා සහන ලබා දීමට රුපියල් මිලියන 15 ක් වෙන් කරන ලදී. එක්වරක දී පමණක් ලබා දෙන ආධාර වශයෙන් එක් ධීවරයෙකුට රුපියල් 5000.00 ක් ලබා දුනි. ධීවර දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

iii. කොවිඩ් වසංගතයෙන් වූ බලපෑම්වලට ප්‍රතිචාර ලෙස මඩකලපුව, කළුතර, මන්නාරම, මාතලේ, මොණරාගල සහ මුලතිවු දිස්ත්‍රික් වල ජීවත් වන ගර්භණී සහ කිරිදෙන මව්වරු 1,517 සඳහා රුපියල් මිලියන 15.17 ක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් බෙදා දී ඇත. ආහාර මල්ලක් මිල දී ගැනීම සඳහා එක් මවකට රුපියල් 10,000 ක් ලබා දී ඇත.

iv. සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත රුපියල් මිලියන 1.5 ක් ලබා දෙන ලද්දේ තෙල් සහ රසායනික කාන්දුවීම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා සහ ජාතික වශයෙන් තෙල් සහ රසායනික ද්‍රව්‍ය කාන්දුවීමේ දී ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව අදාල පාර්ශවයන් තුල වැඩි දියුණු කිරීම සඳහායි.

## 2. ආහාර අනාරක්ෂිත ප්‍රදේශවල සිටින පාසල් වයසේ දරුවන්ට වසර පුරා ආහාර ලැබීම සඳහා ප්‍රවේශය

පාසල් ආහාර වැඩසටහන සාමාන්‍යයෙන් සලකන්නේ අධ්‍යාපනයට අවතීර්ණ වීමට සමාන පහසුකම් ලබා දෙන හා ඉගනීමේ අවස්ථා වැඩිදියුණු කරන, අධ්‍යාපනයට ඇතුළු විය හැකි මෙවලමක් ලෙසයි. ඒ අනුව, පාසල් ආහාර වැඩසටහන නිර්මාණය කර ඇත්තේ දේශීය ආහාර නිෂ්පාදනය සම්බන්ධ කර ගෙන පෝෂණීය ආහාර වේලක් ලබා දීම මඟින් අධ්‍යාපනයේ අරමුණු වලටත් එහා ගිය පෝෂණීය හා ආර්ථික ප්‍රතිඵල ලැබෙන බහු විධ මැදිහත් වීමක් ලෙසිනි. මෙවැනි ආකාරයේ ඒකාබද්ධ පාසල් දිවා ආහාර වැඩසටහන් දිර්ඝ කාලීනව දූගීබව අඩු කිරීමටත්, අධ්‍යාපනයේ ආයෝජනවලට ලැබෙන ප්‍රතිලාභ උපරිම කිරීමටත් උපකාරී වේ. ඒ අනුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණ උපකාර සහිතව පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

i. නිවාස ආශ්‍රිත පාසල් දිවා ආහාර වැඩසටහන

සුළු පරිමාණ ගොවීන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම, පාසල් පෝෂණය ඒකාබද්ධ කිරීම, දේශීය ආර්ථිකය වර්ධනය වැඩි දියුණු කිරීම, වැනි ධනාත්මක බලපෑම් මඟින්, දුගීබවේ විෂම චක්‍රය බිඳ දැමීම මඟින් ඊ ළඟ පරපුරේ පෝෂණය සහ අධ්‍යාපනය සාර්ථකත්වය කරා මෙහෙය විය හැකිය. දේශීය මිල දී ගැනීම් මඟින් පාසල් ආහාරවලට සම්බන්ධ ඉල්ලුම ඉහල දැමීම කළ හැකිය. දේශීය සුළු පරිමාණ ගොවියාගෙන් නිෂ්පාදන මිල දී ගැනීම මඟින් පාසල් පෝෂණයේ ප්‍රතිලාභ වැඩිදියුණු කල හැකිය. නවෝද්පාදන අංගයක් වන නිවාස ආශ්‍රිත පාසල් ආහාර වැඩසටහන සුළු පරිමාණ ගොවීන්ට පූරෝකථනය කළ හැකි සහ ස්ථාවර දේශීය වෙළඳපළකට ඇතුලුවීමට සහය වන අතර ඒකාබද්ධ ක්‍රියාවලියක් මඟින් කෙරෙන එවැනි ඇතුළු වීම මඟින් උපරිම ප්‍රතිලාභ ලඟා කර දෙයි. දේශීය කෘෂිකර්ම නිෂ්පාදනය සහ සම්බන්ධිත පාසල් දිවා ආහාර වැඩසටහන, සුළු පරිමාණ ගොවීන්ට ව්‍යුහාත්මක හා පූරෝකථනය කල හැකි වෙළඳපළක් නිර්මාණය කිරීම මඟින් වෙළඳපකට සම්බන්ධ වීම පිළිබඳ ඔවුන්ගේ අඩමානය අවම කල හැකිය. නිවාස පාදක පාසල් ආහාර වැඩසටහනේ ඉහලම ඉලක්කය වන්නේ ප්‍රාථමික පාසල් දරුවන්ගේ අධ්‍යාපනික ප්‍රතිඵල සහ පෝෂණය ඉහළ නැන්වීම සඳහා සුළු පරිමාණ ගොවීන් සමග තිරසර සම්බන්ධීකරණය සහිතව පාසල් ආහාර වැඩසටහන වැඩිදියුණු කිරීමයි. ඒ අනුව, තණමල්විල හා විල්ගමුව අධ්‍යාපන කලාප වල පිහිටි පාසල් 10 ක පහත කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

අ) වෙළඳපළ මධ්‍යස්ථානයක් පිහිටුවීම.

සුළු පරිමාණ ගොවීන් සඳහා වෙළඳපල සම්බන්ධතා ශක්තිමත් කිරිම උදෙසා වෙළඳපල මධ්‍යස්ථාන දෙකක් අධ්‍යාපන කලාප දෙකෙහි ස්ථාපනය කරන ලදී. ආයෝජනය රුපියල් මිලියන 1.75 කි.

ආ) ආහාර සැපයුම්කරුවන් සඳහා සහාය

ආහාර සැපයුම්කරුවන් 84ක් සඳහා සනීපාරක්ෂාව සහ පෝෂ්‍යාදායි ආහාර පිසීම සඳහා පහසුකම් සැපයීම සඳහා දාහක, ඉවුම් උපකරණ සහ පාසල් ආහාර වැඩසටහන සම්බන්ධ අනෙකුත් උපකරණ ඇතුළු ද්‍රව්‍ය සපයන ලදී. ආයෝජනය කරන ලද මුදල රුපියල් මිලියන 3.7කි.

ඇ) කුකුළු ගොවීන් සඳහා සහාය

පාසල් දිවා ආහාර වැඩසටහන සඳහා බිත්තර සපයා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා කුකුළු ගොවීන් 33 දෙනෙකුට පැටවුන්, කුකුළු නිවාස සහ කුකුළු ආහාර සපයන ලදී. තාක්ෂණ සහය ලබා දෙන ලද්දේ රජයේ පශු වෛද්‍ය කාර්යාල මඟිනි. රුපියල් මිලියන 6.04 ක් ආයෝජනය කරන ලදී.

ඈ) කුකුළු ආහාර නිෂ්පාදන ඒකකයක් ඉදිකිරීම.

කුකුළුළන් ඇති කරන ගොවීන් සඳහා කුකුළු කෑම නිෂ්පාදනය කිරීමට විල්ගමුවේදී කුකුළු ආහාර නිෂ්පාදන ඒකකයක් පිහිටුවන ලදී. උපකරණ සහ යන්ත්‍ර ප්‍රතිලාභියා වෙත ලබා දුන් අතර එහි වටිනාකම රුපියල් මිලියන 1.16 කි.

ඉ) පුහුණු සහ ධාරිතාව ඉහළ නැංවීම

බෝග වගාව, කුකුළු පාලනය, කුකුළු ආහාර නිෂ්පාදනය සහ ව්‍යාපාර සංවර්ධන සැලැසුම් ආදිය ඇතුලත් විවිධ වර්ගයේ පුහුණු වැඩසටහන් 36 ක් ප්‍රතිලාභීන් සඳහා පවත්වන ලදී. ආයෝජනය රුපියල් මිලියන 0.8 කි.

ii. ටින් මාළු බෙදා හැරීම

රුපියල් මිලියන 131.5 ක් වටිනා මෙට්‍රික් ටොන් 189.45 ක ටින් මාළු ලෝක ආහාර වැඩපිලිවෙළ හරහා ජපාන රජය විසින් පරිත්‍යාග කරන ලදී. එම ටින් මාළු තොගය අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ළමුන් 220,000කට බෙදා දෙන ලදී. වසංගත තත්වය තුල පාසල් වසා තිබූ නිසා නිවසට රැගෙන යාමේ සලාකයක් ලෙස ආහාර බෙදා දෙන ලදී. එයට අතිරේකව රුපියල් මිලියන 39 ක් අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දෙන ලද්දේ ආහාර නිවසට රැගෙන යන ආහාර සලාකයට අවශ්‍ය ආහාර වර්ග මිල දී ගැනීමටයි.

## 3. ශ්‍රී ලංකාවේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සහ සුළු පරිමාණ ගොවීන් වසර පුරා ජීවනෝපාය සහ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.

අවදානමට ලක්වන ප්‍රජාවේ ජීවනෝපාය වැඩසටහන් විවිධාංගීකරණය කිරීම තුලින් ස්වභාවික කම්පනවලට එරෙහිව ගොඩ නැගීමේ ව්‍යාපෘතිය යටතේ ජලය රැස් කිරීමේ හැකියාව හා ගබඩා කිරිමේ පහසුකම් නිවාසලාභීන් තුල ගොඩ නැගීම, වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම, තරුණයින් සඳහා කෘෂිකර්මික සංවර්ධනය වැනි වැඩසටහන් ඇතුලත්ය. ඒ අනුව, මඩකලපුව, මන්නාරම, මාතලේ, මොණරාගල සහ මුලතිව් යන දිස්ත්‍රික් 05 හි කාලගුණික විපර්යාස නිසා පීඩාවට පත් ජනතාවට සහය වීම සඳහා ඉහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.

**i. සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය**

2019 සිට 2022 දක්වා වසර 04 ක කාලය තුල කුඩා වැව් 80ක් ප්‍රතිසංස්කරණය කිරිම ඉලක්කය වේ. ඒ අනුව, 2021 දී වැව් 23 ක් ප්‍රතිසංස්කරණය කරන ලද අතර රුපියල් මිලියන 85.47 ක් ආයෝජනය කරන ලදී. වාරි ඉඩම් ප්‍රමාණය අක්කර 1,103 සිට 1,393 දක්වා 27% කින් ඉහළ නැංවිණි. අපේක්ෂිත වී අස්වැන්න මෙට්‍රික් ටොන් 3,860 සිට මෙට්‍රික් ටොන් 5,850 ක් දක්වා 34% කින් වැඩිවිය. ගොවීන් 782ක් වැව් ප්‍රතිසංස්කරණ වැඩවලට සහභාගී විය. ඔවුන් සඳහා දිනකට රුපියල් 1,100ක් බැගින් මාසයකට දින 20ක් හා මාස 06 කාලයක් පුරා ගෙවීම් කරන ලදී. ප්‍රතිලාභීන් සඳහා මුළු මුදල් ගෙවීම රුපියල් මිලියන 43කි. පවුල් 900ක් ප්‍රතිලාභ ලබන ලදී.

**ii. කෘෂි ළිං ප්‍රතිසංස්කරණය කිරීමට සහය වීම**

නියං සමයේ දී කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය රැස් කර ගැනීමට හැකි වන පරිදි ගොවි පවුල් 950ක් වෙනුවෙන් කෘෂි ළිං 950ක් අලුතින් ඉදි කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම ඉලක්කය විය. එයට අතිරේකව ප්‍රතිලාභීන් වෙත අවශ්‍ය පුහුණුව, බීජ හා රෝපණ ද්‍රව්‍ය සහ වෙළඳපල සබඳතා ලබා දෙන ලදී. 2021 දී ඉලක්ක කල ප්‍රතිසංස්කරණය කරන කෘෂි ළිං සංඛ්‍යාව 201 ක් වු අතර කෘෂි ළිං 182 ක් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කර නිම කරන ලදී. ආයෝජිත මුදල රුපියල්

මිලියන 33.48කි.බොහෝමයක් ගොවීන් කෘෂි ළිං විශාල කිරීමට සහ ළිංවල ඉදිකිරීම්හි ගුණත්වය දියුණු කිරිම සඳහා ව්‍යාපෘති ආධාරවලට අතිරේකව ඔවුන්ගේ මුදල් යෙද වූ බව නිරීක්ෂණය විය. නිවාසලාභියකු සඳහා රුපියල් 184,000ක මුදලක් ලබා දෙන ලදී.

**iii. කෘෂි පොකුණු ඉදිකිරීම**

කෘෂි පොකුණු 62 ක් මොණරාගල සහ මාතලේ දිස්ත්‍රික්වල ඉදි කරන ලද්දේ වර්ෂා ජලය සහ අපවහන ජලය රැස් කිරීමටයි. එම ජලය වියළි කාලයේ දී භාවිතා කෙරේ. එයට අතිරේකව සමහර ගොවීන් මිරිදිය මත්ස්‍ය වගාව ද පොකුණු තුල සිදු කරන ලදී. මුළු ආයෝජනය රුපියල් මිලියන 4.96 ක් විය.

**iv. තරුණයින් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම**

ව්‍යාපෘතියේ අරමුණ වූයේ තරුණ තරුණියන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා ඔවුනුගේ හැකියාව වැඩි දියුණු කිරීම පිණිස පුහුණු කිරීමයි. ආධුනිකයින්ට මෝටර් රථ, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ උපකරණ අලුත්වැඩියා කිරීම යන ක්ෂේත්‍ර යටතේ පුහුණු වීම් ලබා දෙන ලදී. 2021 වසරේ දී පාසල් හැර ගිය සිසුන් 43ක් පුහුණු කර ඇති අතර පුහුණු කාලය තුල ඔවුන්ට මාසික දීමනා ගෙවා ඇත. තවද ඔවුන්ගේ පුහුණු වීමෙන් පසු ඔවුන් හට මෙවලම් කට්ටල ලබා දී ඇත. එයට අතිරේකව විල්ගමුව, තණමල්විල සහ තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි වෘත්තීය සමිති මධ්‍යස්ථාන තුනක පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය උපකරණ හා මෙවලම් ලබා දීමෙන් සහ එම පුහුණු ආයතන අලුත් වැඩියා කිරීමෙන් ශක්තිමත් කර ඇත. මුළු ආයෝජනය රුපියල් මිලියන 9.5කි.

**v. වාණිජ වැව්ලි ශක්තිමත් කිරීම**

කොවිඩ් 19 වසංගතය සහ කාලගුණික පීඩාවන්ගෙන් අවදානමට ලක් වන ගොවීන්ගේ ආදායම සහ පෝෂණ තත්වය ඉහල නැංවීම මෙම ව්‍යාපෘතියේ ඉලක්කය විය. අඹ සහ කජු පැළ මඩකලපුව, මන්නාරම, මාතලේ, මොණරාගල සහ මුලතිවු දිස්ත්‍රික්වල සිටින ප්‍රතිලාභීන් වෙත බෙදා දෙන ලදී. තෝරා ගත් ප්‍රතිලාභියකු වෙත කජු පැළ 20ක් හෝ TJC අඹ පැළ 25ක් ලබා දෙන ලදී. ඒ අනුව, ගොවීන් 1,132ක් අතර TMJ අඹ පැළ 28,300ක් සහ ගොවීන් 1,160ක් අතර කජු පැළ 23,200ක් බෙදා දෙන ලදී. මුළු ප්‍රතිලාභීන් ගණන 2,292කි.මෙම ව්‍යාපෘතිය උක්, බඩඉරුඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි ආශ්‍රිත කර්මාන්ත අපනයන ප්‍රවර්ධන ඇතුළු සුළු බෝග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා කජු සංස්ථාව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදී. ලෝක ආහාර වැඩසටහන රුපියල් මිලියන 5.8ක් ආයෝජනය කරන ලදී. 2021 මහ කන්නයේ දී පැළ ස්ථාපනය කරන ලදී.

**vi. ජීවනෝපාය සංවර්ධන කටයුතු**

සුළු පරමාණ ගොවීන්ගේ හැකියාවන් ශක්තිමත් කිරිම සඳහා ව්‍යාපෘතිය සහාය විය. එළු පාලනය, කුකුළු පාලනය. ගව පාලනය,මත්ස්‍ය පැටවුන් ජලාශ තුල ඇති කිරීම සහ ජීවනෝපාය කටයුතු සම්බන්ධ පුහුණුව සහ දැනුවත් කිරිම් ආදි කටයුතු ක්‍රියාකාරකම්වලට ඇතුලත් විය.

**අ) එළු ගොවිපොළවල් ක්‍රියාත්මක කිරීම**

එළුවන් සඳහා නිවාස 175 ක් පිහිටුවීම ඉලක්කය වූ අතර සම්පූර්ණයෙන් අවසන් කල හැකි වූයේ එළුවන් සඳහා නිවාස 172කි. ප්‍රතිලාභීන් තෝරා ගන්නා ලද්දේ දැනට එළු පාලනයේ නියුතු එළු ගොවීන් අතරිනි. නව එළු නිවාසයක් ගොඩ නැගීම සඳහා ගොවි මහතෙකුට රුපියල් 215,000.00ක් ලබා දෙන ලදී. සම්පූර්ණ ආයෝජනය රුපියල් මිලියන 37.63ක් විය.

**ආ) කුකුළු ගොවිපළ ක්‍රියාත්මක කිරීම**

කුකුළු ගොවිපොළ 145ක් ආරම්භ කිරීම ඉලක්කය වූ අතර කුකුළු ගොවිපළ 145ක්ම පිහිටුවන ලදී. තෝරා ගත් ප්‍රතිලාභීන් වෙත කුකුළු පැටවුන්, කුකුළු නිවාස සහ මාස 4කට අවශ්‍ය කුකුළු කෑම ලබා දෙන ලදී. කුකුළු නිවාස සෘජුවම නිවාස වෙත සපයන ලද අතර කුකුළු පැටවුන් සහ සත්ව ආහාර මිලදී ගැනීම සඳහා රුපියල් 22,300.00ක් ගොවියකු වෙත ලබා දෙන ලදී. රුපියල් මිලියන 3.18 ක මුදලක් ආයෝජනය කරන ලදී.

**ඇ) ගව පාලන ඒකක ක්‍රියාත්මක කිරීම**

ගව මඩු 143ක් පිහිටුවීම ඉලක්කය වූ අතර සම්පූර්ණ කරන ලද්දේ ගව මඩු 120කි. ගව මඩුවක් සෑදීම සඳහා එක් ප්‍රතිලාභියෙකුට රුපියල් 285,000ක් සහ තෘණ වගාව සඳහා රුපියල් 5,000.00 ක් ලබා දෙන ලදී. සම්පූර්ණ ආයෝජනය රුපියල් මිලියන 37.8කි.

**ඈ) ජලාශ තුල ඇඟිල්ලන් තැන්පත් කිරීම**

මිලියන 02කට අධික මත්ස්‍ය ඇඟිල්ලන් මිරිදිය ජලාශ 23ක තැන්පත් කරන ලද්දේ ජාතික ජලජ සංවර්ධන අධිකාරියේ තාක්ෂණික සහයෙනි. බලාපොරොත්තු මත්ස්‍ය අස්වැන්න මෙට්‍රික් ටොන් 975කි. (පැවැත්මේ අනුපාතය 65% සහ සාමාන්‍ය මත්ස්‍යකුගේ බර ග්‍රෑම් 750 කි.) සම්පූර්ණ ආයෝජනය රුපියල් මිලියන 5.13කි.

**ඉ) ජීවනෝපාය කටයුතු පිළිබඳ පුහුණුව හා දැනුවත් කිරීම**

ජීවනෝපාය ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණුව සහ දැනුවත් කිරීම් වැඩසටහන් 285ක් පැවැත්වීමට ඉලක්ක කල ද කොවිඩ් වසංගතය නිසා සම්පූර්ණ කළ හැකි වූයේ වැඩසටහන් 121කි. සම්පූර්ණ ආයෝජනය රුපියල් මිලියන 1.2කි.

## 4. ශ්‍රී ලංකාවේ අවුරුදු 5 ට අඩු දරුවන්ගේ , නව යෞවුන් වියේ ගැහැණු දරුවන්ගේ සහ සඵල වයසේ කාන්තාවන්ගේ පෝෂණය 2025 වන විට වැඩි දියුණු කිරීම

### i. ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩඉරිඟු ප්‍රසම්පාදනය

ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු මිල දී ගැනිමට ව්‍යාපෘතිය සහය විය. ඒ අනුව කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමට රුපියල් මිලියන 192.08 ක් ප්‍රදානය කරන ලදී. මිල දී ගත් බඩඉරිඟු තොගය මෙට්‍රික් ටොන් 2,159කි. ත්‍රිපෝෂ අලෙවියෙන් ලැබෙන ආදායම බඩඉරිඟු ගබඩා කිරීම සඳහා නව සයිලෝස් ඉදි කිරීමට යොදා ගනී.

**ii. ආහාර සුරක්ෂිතතා තක්සේරුව**

ආහාර ලබා ගැනීමේ හැකියාව, ප්‍රවේශතාවය, භාවිතය සහ ස්ථාවරත්වය අසමාන ලෙස බෙදීයාම හේතුවෙන් දිස්ත්‍රික්ක තුල පවා ආහාර අනාරක්ෂිතභාවයේ සැලකිය යුතු වෙනසක් ඇති බැවින් ආහාර අනාරක්ෂිතභාවය සඳහා කඩිනම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය, බලපෑමට ලක්විය හැකි දිස්ත්‍රික්ක හා කොට්ඨාශ හඳුනා ගැනීමට තීරණය විය. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වූයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආහාර අනාරක්ෂිතභාවයේ අවකාශීය නිරූපණය දැක්වෙන සිතියම් සැකසීමයි. අනෙකුත් ප්‍රතිලාභ වනුයේ රටේ ආහාර සුරක්ෂිතතා තත්වය තක්සේරු කිරීම සහ අවධානයට ලක් විය හැකි කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සංවර්ධන මැදිහත්වීම් යෝග්‍ය ලෙස සකස් කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීමට පහසුකම් සැපයීම සඳහා තොරතුරු සැපයීමයි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය මෙම අධ්‍යනය සිදු කරන ලදී.

**සාරාංශගත මූල්‍ය ප්‍රගතිය**

මූල්‍ය ප්‍රගතිය - 2021 (රු. මි.)

| මූල්‍ය කේතය | ප්‍රතිපාදන | සංශෝධිත | නිදහස් කල ප්‍රතිපාදන | වියදම | % |
|---|---|---|---|---|---|
| 13 | 370.0 | 528.08 | 528.08 | 528.08 | 100 |
| 17 | 105.0 | 69.00 | 69.00 | 58.028 | 86 |
| 16 | 300.0 | - | - | - | - |
| **Total** | **775.0** | **597.08** | **597.08** | **586.108** | **94** |

…………………………………………………………

**ප්‍ර.ග.නි/ග.නි/ආයතන ප්‍රධානී අත්සන**

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

**03 පරිච්ඡේදය- 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**ඒසීඒ-එෆ්**

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2021 රු. | | සටහන | තතය 2021 රු. | නැවත ගලපන ලද 2020 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | **1** | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **2** | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | **3** | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **4** | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 210,094,000 | 108,053,408 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 73,835 | 85,906 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | 11,375,698 | 7,232,008 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **221,543,533** | **115,371,322** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **221,543,533** | **115,371,322** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 1,402,031 | 912 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **220,141,502** | **115,370,409** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | - | |
| 127,900,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 105,035,578 | 83,748,297 | |
| 45,595,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 33,727,356 | 20,017,346 | **ඒසීඒ-2(ii)** |
| 2,300,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 1,278,122 | 950,429 | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | - | - | |
| **175,795,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **140,041,055** | **104,716,072** | |
| | **මූලධන වියදම්** | | | | |
| 6,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 6,859,480 | 1,216,613 | |
| 5,360,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 7,182,999 | 3,887,968 | |
| 775,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 586,114,559 | - | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 5,500,000 | හැකියා වර්ධනය | **14** | 61,000 | 794,770 | |
| 14,064,620,000 | වෙනත් මූලධන වියදම් | **15** | 10,011,290,662 | 32,158,606 | |
| **14,856,480,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **10,611,508,701** | **38,057,957** | |
| | තැන්පතු ගෙවීම් | | 81,285 | 78,456 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 15,032,558 | 6,938,967 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **15,113,843** | **7,017,423** | |
| | **මුළු වියදම් එ =** | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | **(ඊ+උ+ඌ)** | **10,766,663,600** | **149,791,451** | |
| **15,032,275,000** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | (10,546,522,098) | (34,421,042) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | (10,546,522,098) | (34,421,042) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | - | - | **ඒසීඒ-3** |
| | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2021 දෙසැම්බර් 31 දිනට**
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය<br>**2021**<br>රු. | **2020**<br>රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 121,445,431 | 87,441,485 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 17,699,015 | 14,042,155 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 1,402,031 | 912 |
| **මුළු වත්කම්** | | **140,546,477** | **101,484,552** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 17,699,015 | 14,034,705 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 121,445,431 | 87,441,485 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | 7,450 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 1,402,031 | 912 |
| **මුළු වගකීම්** | | **140,546,477** | **101,484,552** |

පිටු අංක 7 සිට 37 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 38 සිට 46 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ........................ | ................ | ........................ |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : වී.පී.කේ. අනුෂ පැල්පිට | නම : ආර්.එච්.ඩබ්.ඒ. කුමාරසිරි | නම : ඩබ්.එස්.පී. ද මෙල් |
| තනතුර : ලේකම් | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් | |
| දිනය : 2022.02.25 | දිනය : 2022.02. 21 | දිනය : 2022.02. 21 |

වී. පී. කේ. අනුෂ පැල්පිට
ලේකම්
ආර්ථික ප්‍රතිපත්ති හා
සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

ඩබ්ලිව්.එස්.පී. ද මෙල්
ගණකාධිකාරී
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
පළමු මහල, මහලේකම් ගොඩනැගිල්ල
කොළඹ - 01

2

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | | ඒසීඒ-සී |
|---|---|---|
| **2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | |
| | තත්‍ය<br>**2021**<br>රු. | නැවත ගලපන ලද<br>**2020**<br>රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 883,060,702 | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 6,530,794 | 5,112,407 |
| අග්‍රිම ලැබීම් | 210,094,000 | 108,053,408 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 15,228,347 | 7,337,681 |
| තැන්පතු ලැබීම් | 73,835 | 85,906 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,114,987,678** | **120,589,402** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,097,173,757 | 111,683,335 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,278,122 | 950,429 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 233,332 | 1,174,153 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 1,402,031 | 912 |
| අත්තිකාරම් ගෙවීම් | 14,819,151 | 6,702,117 |
| තැන්පතු ගෙවීම් | 81,285 | 78,456 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,114,987,678** | **120,589,402** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | - | - |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | - | - |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | - | - |
| | | |
| **+ (ඊ)** | - | - |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - -

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 175,795,000 | 176,420,118 | 140,041,055 | 79.38 |
| ප්‍රාග්ධන | 14,856,480,000 | 14,859,704,992 | 10,611,508,701 | 71.41 |
| මුළු එකතුව | **15,032,275,000** | **15,036,125,110** | **10,751,549,757** | **71.50** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | අදාල නොවේ | | | | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 33,810,000 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 87,635,431 | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුණුම I ලෙස දක්වා ඇත.

# 04 පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති ගණන | 100% | | |
| අගයන ලද ව්‍යාපෘති යෝජනා ගණන | 96.68 % | | |
| සපයන ලද නිරීක්ෂණ ගණන | 100% | | |
| අගයන ලද ජාතික/ උප ජාතික සැලසුම් ගණන | 93.75% | | |
| නිර්දේශ කරන ලද යෝජනා ගණන( DCB) | 98% | | |

## 05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස ආර්ථිකමය සහ සාමාජීය වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අංශ 9කට සහ උප අංශ 26කට වෙන් කර ඇත.එක් එක් අංශය ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් සිදුකරනු ලබන ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු නිර්දේශවලට යටත්ව සිදු කෙරේ. ඒ අනුව, අදාළ අමාත්‍යාංශ මගින් මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා රු.මිලියන 10ට වැඩි සියළුම ව්‍යාපෘති වාර්තා අදාළ ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියට අනුව මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි. එම ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ සඳහන් වන 11 වන කාණ්ඩය අනුව යෝජිත ව්‍යාපෘති මඟින් තිරසර සංවර්ධන අරමුණු වලට දක්වන දායකත්වය පිළිබඳව ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ අනුව, දර්ශක 244 කින්, ඉලක්ක 169 කින සහ අරමුණු 17 කින් සමන්විත 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට අදාළ සියළු තිරසර සංවර්ධන අරමුණු (17), ඉලක්ක සහ ප්‍රතිපත්තිමය තීරණ මෙම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ඇගයීමේදී සලකා බලනු ලබයි.

තවද, තිරසර සංවර්ධන අරමුණු දැනටමත් ගෝලීය වශයෙන් හඳුනාගෙන ඇති අතර එම අරමුණු අපගේ සංවර්ධන ක්‍රියාදාමයට අනුගත කර ගැනීම සිදු කරයි.එබැවින්, මෙම දෙපාර්තමේන්තුවට අදලව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනාගැනීමක් සිදු කරනු නොලැබේ.ඒ අනුව, රාජ්‍ය ආයෝජන සැලැස්ම , සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු 17ට අනුගත වෙමින් සකස් කරනු ලැබේ. එසේම, එක් එක් අමාත්‍යාංශ සහ ආයතන මඟින් සංවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේදී එම ආයතන සඳහා අදාළ වන තිරසර සංවර්ධන අරමුණු ඒ සඳහා අනුගත කරගැනීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබා දේ.

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන සභාව සමඟ සහයෝගීත්වයෙන් සියළුම අමාත්‍යාංශ සම්බන්ධීකරණයෙන් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය නායකත්වය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් ලබාදේ.

2022 වර්ෂයේ ස්වේච්ඡා ජාතික ඇගයීම සඳහා ශ්‍රී ලංකාව තෝරාගෙන ඇති බැවින්, තිරසාර සංවර්ධන සභාව සමඟ එක්ව ඒ සඳහා අවශ්‍ය කාර්යයන් 2021 වර්ෂය තුලදී හා 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව, ස්වේච්ඡා ජාතික ඇගයීම සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා මහාභාණ්ඩාගාරයේ ලේකම්තුමාගෙන් අනුමැතිය අනුව මෙහෙයුම් කමිටුවක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ තිරසාර සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද අතර මෙම කමිටු සාකච්ඡා කිහිපයක් පවත්වන ලදි. ඊට අමතරව තිරසාර සංවර්ධන සභාව සංවිධානය කරන ලද ජාතික සහ පළාත් වැඩමුළුවලට සහභාගි වී අවශ්‍ය මගපෙන්වීම් ලබා දී ඇත. එමෙන්ම එක්සත් ජාතීන්ගේ

නියෝජිතායතනය සමඟ 2023 -2027 කාලපරිච්ඡේදය සඳහා අත්සන් කිරීමට නියමිත තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව සකස් කිරීමේ දී සහ ලෝක ආහාර වැඩසටහන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල , එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල,එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මෙන්ම අනෙකුත් සංවර්ධන පාර්ශවකරුවන් සමඟ එක්ව දේශිය වැඩසටහන් ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේදී ද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක පිළිබඳව විශේෂයෙන් සලකා බලනු ලබයි.

## 06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 71 | 48 | 23 |
| තෘතීයික | 02 | 01 | 01 |
| ද්විතියික | 52 | 41 | 11 |
| ප්‍රාථමික | 40 | 33 | 07 |

### 06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින මානව සම්පත් හිඟය හේතුවෙන් එක් නිලධාරියෙකුට අංශ කිහිපයක රාජකාරි ආවරණය කිරීමට සිදුවීමෙන් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු කරා ළගා වීමට කාර්යාල වේලාවෙන් බැහැරවත් රාජකාරි ඉටුකිරීමට සිදුවෙයි.

### 06.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| වෘත්තිකයින් සඳහා වන ඉංග්‍රිසි ඩිප්ලෝමා පාඨමාලාව | 01 | සති 36 | 75,000.00 (ගාස්තු වලින් නිදහස් කර ඇත.) | | දේශීය | දෙවන භාෂාව පිළිබඳ වෘත්තීය භාවිතය වැඩිදියුණු වීම |
| වාර්තා ලිවීමේ කුසලතාව | 01 | 03 දිනක් | 5000.00 | | දේශීය | කාර්යාලීය ලිපි, වාර්තා සකස් කිරීමේ නිපුනතාවය ලැබීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 02 | 01 දිනක් | 7,000.00 | | දේශීය | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව කාර්යක්ෂමව නිවැරදිව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වීම |
| කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩමුළුව | 04 | 04 දිනක් | 28,000.00 | | දේශීය | රාජකාරී ඉටු කිරීමේ දී කාර්යාල ක්‍රම/මුදල් රෙගුලාසි නිවැරදිව හැසිරවීමේ හැකියාව |
| වැටුප් පුහුණු පාඨමාලාව | 01 | දින 04 | 5,000.00 | | දේශීය | කාර්යක්ෂමව හා නිවැරදිව වැටුප් සකස් කිරීම |
| යෙදවුම් නිමවුම් ආකෘති විශ්ලේෂණය | 51 | දින 06 | - | | දේශීය | ව්‍යාපෘති ඇගයීමේ(නිවැරදිව/පහසුවෙන්) හැකියාව |
| ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණය | 55 | දින 08 | - | | දේශීය | ව්‍යාපෘති ඇගයීමේදී හා ඒ පිළිබඳව තීරණ ගැනීම පහසු වීම |
| භෞතික තිරසාරකත්වය වැඩමුළුව | 01 | 10 දිනක් | මාර්ගගත ක්‍රමවේදය මගින් | විදේශීය | | තිරසාර සංවර්ධන ඉලක්ක නිවැරදිව හඳුනාගැනීමේ හා මෙහෙයවීමේ හැකියාව |
| ආසියා පැසිපික් රටවල් සඳහා කලාපීය සම්මන්ත්‍රණය සහ තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ පාඨමාලාව | 01 | 02 දිනක් | මාර්ගගත ක්‍රමවේදය මගින් | විදේශීය | | තිරසාර සංවර්ධන ඉලක්ක නිවැරදිව හඳුනාගැනීමේ හා මෙහෙයවීමේ හැකියාව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන -විශේෂ මාතෘකා | 01 | 03 දිනක් | මාර්ගගත ක්‍රමවේද ය මගින් | විදේශීය | | ප්‍රතිපත්ති තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| සංවර්ධනය වන රටවල් සඳහා රාජ්‍ය සේවය සහ දුප්පත් කම දුරලීම සම්මන්ත්‍රණය | 01 | සති 01 | මාර්ගගත ක්‍රමවේද ය මගින් | විදේශීය | | ප්‍රතිපත්ති තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| වනිතා ආර්ථිකය සවිබල ගැන්වීමේ ප්‍රතිපත්ති සැකසීම පුහුණු වැඩමුළුව | 01 | සති 02 | මාර්ගගත ක්‍රමවේද ය මගින් | විදේශීය | | ප්‍රතිපත්ති තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| උපායමාර්ග ගොඩනැන්වීම - IMF SARTTAC වාචික වැඩමුළුව | 01 | 03 දිනක් | මාර්ගගත ක්‍රමවේද ය මගින් | විදේශීය | | ප්‍රතිපත්ති තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| චීනයේ සංවර්ධනය කෙරෙහි මූල්‍ය සේවාවන් සම්මන්ත්‍රණය | 02 | 02සති | මාර්ගගත ක්‍රමවේද ය මගින් | විදේශීය | | ප්‍රතිපත්ති තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

## 07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම්සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අදාල නොවේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | **අනුකූල වේ** | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | **අනුකූල වේ** | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | **අනුකූල වේ** | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | **අනුකූල වේ** | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | **අදාල නොවේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**අවසානය.**

මගේ අංකය / எனது இல. / My No. } ඊපීඩී/සී/එන්පීඩී/2021/එෆ්ඒ/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජුනි 17 දින

**ගණන්දීමේ නිලධාරී**

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

2021 වර්ෂය සඳහා අග්‍රිම අවශ්‍යතාව ලෙස රු.235,135,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඉන් රු.171,825,664 ක් ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව රු.63,309,336 ක් අග්‍රිම අධි ඇස්තමේන්තු කර තිබුණි. එසේම 2021 දෙසැම්බර් මාසය සඳහා රු.19,685,000 ක් අග්‍රිම අවශ්‍යතා ලෙස සැලසුම් කර තිබූ නමුත් එම අවශ්‍යතාවය ඉක්මවා රු.22,404,222 ක් අග්‍රිම ඉල්ලුම් කර තිබුණි. මේ අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීම හා අග්‍රිම ඉල්ලුම් කිරීමේ කළමනාකරණය දුර්වල වී තිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන නිෂ්ඵල වීම**

වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.3,100,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 19 කට එකතුව රු.13,358,167,610 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.4,250,195,132 ක් වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 98 ක අතර පරාසයක ප්‍රමාණයක පැවතුණි.

### 2.3 බැඳීම් හා බැරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය ප්‍රකාරව සටහන් අංක (iii) යටතේ ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සියළුම බැඳීම් හෙළිදරව් කළ යුතු වුවත්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA – 92 අනුව එකතුව රු.6,265 ක් වූ බැඳීම් මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු සටහන් (iii) අනුව 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ, භාණ්ඩාගාරය විසින් එක් එක් වැය විෂයය වලට නිකුත් කරනු ලබන බැඳීම්, බැරකම් ප්‍රකාශය සමඟ සසඳා තිබිය යුතුය. භාණ්ඩාගාරයේ SA – 92 සමුච්චිත බැරකම් වාර්තාවේ එකතුව රු.776,593 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් (iii) හි ඇතුළත් කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ) මුදල් රෙගුලාසි 104 (1) (අ) ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාහන 02 කට සිදුවී තිබුණු අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් දින 07 ක් ඇතුළත ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවල ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම අනතුරු පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව දින 28 ක් හා මාස 4 කට වැඩි කාලයක් ප්‍රමාද කර ඉදිරිපත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104 (4) ඡේදය ප්‍රකාරව ඉහත සඳහන් වාහන අනතුරු සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුළත මු.රෙ. 104(4) ප්‍රකාර පූර්ණ වාර්තා ඉදිරිපත් කළ යුතුව තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් එක් වාහනයක් සඳහා මාස 04 කට ආසන්න කාලයක් ප්‍රමාද කර වාර්තාව ඉදිරිපත් කර තිබුණි. අනෙක් වාහනය සඳහා 2022 මැයි 18 දින වන විට මාස 14 ක කාලයක් ගත වී තිබුණත්, එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 139 (4) ඡේදය ප්‍රකාරව සහතික කරන ලද වවුචර් වෙනුවෙන් ගෙවීම් කිරීමට ගෙවන නිලධාරියා විසින් ගෙවනු ලබන සෑම මුදලකටම විධිමත් කුවිතාන්සියක් ලබා ගන්නා බව ගණන්දීමේ නිලධාරියාට වගකිවයුතු වන්නේය. රාජ්‍ය ආයෝජන වැඩසටහන් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවා තිබූ රු. 1,927,072 ක වියදම සම්බන්ධයෙන් විධිමත් කුවිතාන්සි වවුචරය සමඟ අමුණා නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 880 ඡේදය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 1645 (අ) ඡේදය ප්‍රකාරව වාහනය පිළිබඳ විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික බලපත්‍ර, ආයුධ හා අමතර උපකරණ, වාහන වෙන කෙනෙකුට පවරාදෙන විට අඩුවී ඇති උපකරණ හා කොටස් පිළිබඳ සාරාංශය, ටයර්, අළුත්වැඩියා කිරීම, සර්විස් කිරීම, රියදුරන් මාරු කිරීම, වාහන අනතුරු, ගමන් පිළිබඳ මාසික සාරාංශ යන ආදිය සම්බන්ධයෙන් වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි 1646 ඡේදය ප්‍රකාරව වාහන භාර නිලධාරියා විසින් මාසයකට පසු ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම මාසික සාරාංශයේ මුල් පිටපතක්ද සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි.

(උ) මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා ගත යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම ලේඛනය පවත්වා නොතිබුණි.

(ඌ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසු හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නව ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ යුතුව තිබුණි. නමුත් දෙපාර්තමේන්තුවේ වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාවක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

(එ) 2021 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු. 1,402,031 ක් වී තිබුණි. එම ශේෂය එදිනම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.9 ඡේදයට පටහැනිව එම ශේෂය භාණ්ඩාගාරය නිරවුල් නොකළ ශේෂයක් ලෙස සලකා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඒ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම යටතේ රු. 7,182,999 ක් වැය කර තිබුණි. එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එම වියදම දක්වා නොතිබුණි. එම වියදම මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් වැය කිරීම් යටතේ පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් තුළ දක්වා තිබුණි.

### 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුම සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එකතුව රු. 3,696 ක් වූ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

මුදල් රෙගුලාසි 34 (1) අනුව නව ව්‍යාපෘති යෝජනා - මූලධන වියදම් අයවැය ලේඛනයට ඇතුළත් කිරීම සඳහා නව යෝජනා පිළිගනු ලබන්නේ සම්පත් ලබා ගැනීමට ඇති ඉඩකඩ අනුව රජය විසින් අනුමත කර ඇති ආයෝජන ප්‍රමුඛතාවයන් පදනම් කරගෙනය. නියමිත කාර්ය පටිපාටියට අනුකූලව අනුමත කරනු ලැබූ ඇත්තාවූද රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් කරනු ලැබ ඇත්තාවූද ව්‍යාපෘති පමණක් මුදල් සැපයීම සඳහා පිළිගනු ලබයි. ඒ අනුව මධ්‍යකාලීන රාජ්‍ය ආයෝජන රාමුවක් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වේ. ඒ අනුව 2021 – 2024 සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021 අයවැය අවසන් වීමෙන් පසුව පිළියෙල කර තිබූ අතර රාජ්‍ය ආයෝජන වැඩසටහන් මුද්‍රණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී රු.1,927,072 ක් වැය කර තිබුණි.

#### 3.1.2 පවිත්‍රතා කටයුතු

ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ පවිත්‍රතා කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත් ආයතනයක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.242,354 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ දෙපාර්තමේන්තුව ගිවිසුමකට එළඹ තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව පිරිසිදු කිරීම පිළිබඳ වාර්තාවක් කොන්ත්‍රාත්කරු විසින් ලබාදිය යුතුව තිබුණත්, එසේ වාර්තාවක් ලබාගත් බව සනාථ කිරීමේ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ගිවිසුමේ සඳහන් පරිදි සේවයේ යොදවන සේවකයින් විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ පැමිණීමේ ලේඛනයේ දිනපතා පැමිණීම හා පිටවීම සටහන් කළ යුතුව තිබුණත්, අදාල ගෙවීම් කිරීමේදී පැමිණීම හා පිටවීම් ලේඛනය පරීක්ෂා කර නිවැරදි බවට වගකිව යුතු නිලධාරියෙකු විසින් සහතික කර තිබුණු බවට සනාථ කෙරුණ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ දුර්වලතා**

2021 හා 2022 වර්ෂවල දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත් කර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කළ යුතු වුවද, විගණන දිනය වූ 2022 මැයි 12 දින වන විටත් 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පමණක් ඇතුළත් කර තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වාහන භාවිතය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සතු වාහන දෙකක් 2021 වර්ෂයේදී වෙනත් දෙපාර්තමේන්තු වෙත තාවකාලික පදනම මත මුදා හැර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම වාහන විධිමත් පරිදි භාරදීම හෝ ආපසු ලබා ගැනීම හෝ සිදුකර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු වාහනයක් ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත තාවකාලික පදනම මත මුදා හැර තිබුණි. එම දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කරනු ලබන අවස්ථාවේදී 2021 මාර්තු 30 දින අනතුරකට ලක් වී තිබුණි. වාහන අනතුර සම්බන්ධව වරදකරු වූ තෙවන පාර්ශ්වික රක්ෂණ ආයතනය විසින් එම අළුත්වැඩියාව ඉටුකර තිබුණි. එම අළුත්වැඩියාව විධිමත් පරිදි ඉටුකර තිබුණු බව තාක්ෂණ නිලධාරියෙකු විසින් සහතික කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතු වාහනයක් 2021 ජුනි 12 අනතුරකට ලක් වී තිබුණි. එය අළුත්වැඩියාව වෙනුවෙන් පෞද්ගලික ආයතනය විසින් රු. 135,069 කට ඇස්තමේන්තුවක් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. රක්ෂණ සමාගමේ අනුමැතියට යටත්ව අළුත්වැඩියාව සිදු කිරීමට දෙපාර්තමේන්තුව මඟින් දන්වා තිබුණි. ඒ අනුව රු. 68,860 කට අළුත්වැඩියාව සිදුකරගෙන තිබුණි. එම අළුත්වැඩියාව විධිමත් පරිදි ඉටුකර තිබුණු බවට තාක්ෂණ නිලධාරියෙකු විසින් සහතික කර නොතිබුණි.

**3.3.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා**

මු.රෙ. 757 අනුව සෑම මුදල් වර්ෂයක් අවසානයේදී බඩු ලේඛන පොතේ දැක්වෙන ශේෂය සමඟ සෑම භාණ්ඩයක්ම නිවැරදිදැයි බලා භා.භා.ග.ප. 66 (ආණ්ඩුවේ ද්‍රව්‍ය පිළිබඳ වාර්ෂික දෙපාර්තමේන්තු සමීක්ෂණය (858) වැනි මු.රෙ.) ආකෘති පත්‍රය භාණ්ඩ සමීක්ෂණ වාර්තා සමඟ ඉදිරිපත් කළ යුතු වුවත්, සම්පූර්ණ කළ එම ආකෘති ඉදිරිපත් කර නොතිබුණි.

**4. තිරසර සංවර්ධනය**

එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ලභාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම හා ඊට අදාල නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 118 ක් වූ අතර ඉන් තනතුරු 32 ක් පුරප්පාඩුව පැවතුණි. එම තනතුරු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරක්ද, ද්විතීක මට්ටමේ තනතුරු 9 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 6 ක් ද විය.

(ආ) ආයතන සංග්‍රහයේ 13.3 වගන්තිය ප්‍රකාරව, තනතුරකට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළයුතු වුවද, දෙපාර්තමේන්තුවේ පුස්තකාලාධිපති තනතුර අවුරුදු 09 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

ඩී.ඒ.ඒ.වනිගසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට